## 2021/01/19 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2021/01/19 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 5. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 6. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 7. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 8. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 9. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 10. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 12. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 13. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 15. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 16. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 17. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 18. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 19. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 20. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 24. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 01. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 02. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 03. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |

**01. ආගම සිහි කිරීම**

2021.01.19 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

අද සභාවට පැමිණි ගරු උප සභාපතිතුමා, මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඇතුළු කොට ඇති සියළුම දෙනාගෙන් අවසරයි. වර්තමානයේ ඇති වී තිබෙන මේ කොරෝනා වසංගත තත්වය හමුවේ වුවත්, ප්‍රාදේශීය සභාව හැටියට ප්‍රදේශයේ කටයුතු කරන විට ඒ ආබාධ පිළිබඳ තැකීමක් නොකර අපට ඒ කටයුතු කරන්න සිදු වෙනවා. පසුගිය කාලයේ මේ වසංගත තත්වය යම් තාක් දුරකට මැඩපැවැත්වෙයි කියලා අපි බලාපොරොත්තු වුණා. නමුත් මේ කොවිඩ් වසංගත තත්වයේ ව්‍යාප්ත වීම මේ වන විට වර්ධනය වෙලා තියෙනවා. ඒ නිසා වසංගත තත්වය හමුවේ එයට මුහුණ දීලා, එයත් මැඩපවත්වගෙන අපේ කටයුතු කර ගෙන යන්න ප්‍රාදේශීය සභාවට වගකීමක් තියෙනවා. ඒ අනුව අපි නියමිත දින වූ 2021 ජනවාරි මස පළමු සභාව පසුගිය 12 වෙනිදට පවත්වන්න දින නියම වෙලා තිබුනෙ. නමුත් මේ වසංගත තත්වය හමුවේ අපේ මන්ත්‍රීතුමෙකුටත්, එතුමගේ ආශ්‍රිතයන් මෙම රෝගයට ගොදුරු වුන නිසාත්, එතුමා මේ සභාවට පැමිණ ගිය නිසාත්, සෞඛ්‍ය උපදෙස් අනුව අපට සභාව කල්දාන්න සිදු වුණා. ඒ අනුව අපි තව දින 07 ක් පහු කරලා 2021.01.19 වන අද දින සභාව පවත්වන්න කටයුත යොදලා, සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා දැනුවත් කළා. ඒ අනුව මේ අවස්ථාවට පැමිණි මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පිළිගැනීම මගේ යුතුකමක්. මම පළමවෙන්ම ඔබ සියළු දෙනාටම ලැබුවා වූ 2021 වර්ෂය වාසනාවන්ත වර්ෂයක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ එක්කම අද දින පැමිණි ගරු උප සභාපතිතුමා, ප්‍රධාන අපේ සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා මේ අවස්ථාවේ ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නවා. විශේෂයෙන් අද සභා වාරයත් පෙර පරිදිම සෞඛ්‍ය උපදෙස්වලට අනුකූලව පවත්වන්න කටයුතු යොදා තියෙනවා. ඒ වගේම අද සභා වාරය ඉතා අඩු කාල වේලාවකින් නිම කිරීමට ඔබ සියළු දෙනාගේම සහය බලාපොරොත්තු වෙනවා.

**(අ)01. 2020.12.08 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

වෙනත් කරුණු යටතේ ගරු මන්ත්‍රිනී නදීකා දර්ශනී මහත්මිය අදහස් දැක්වීමේදී එක්සත් ජාතික නිදහස් පෙරමුණ පක්ෂයේ ගරු සභාපතිතුමා සහ ගරු ලේකම්තුමාට ස්තූතිය පුද කල නමුත්, සභා වාර්තාවේ එය සටහන් නොවීම අඩුපාඩුවක් ලෙස ගරු මන්ත්‍රිනී නදීකා දර්ශනී මහත්මිය පෙන්වා දෙන ලදී.

**ඉහත සංශෝධනයන්ට යටත්ව 2020.12.08 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රි විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය උඩුගම ඩිපෝව මගින් කැටගල් ලබා ගැනීම සම්බන්ධව 2021.01.07 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. පිබිදෙන උඩුගම පදනම, උඩුගම විසින් යොමු කරන ලද ලේ දන් දීමේ පිංකමක් සිදු කිරීම සඳහා නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් උප කාර්යාල භූමියේ පිහිටි ශ්‍රවනාගාරය මුදල් අය කිරීමකින් තොරව ලබා ගැනීම සඳහා කරන ලද 2021.01.03 දිනැති ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**මුදල් අය කිරීමකින් තොරව ශ්‍රවනාගාරය ලබා දීමට එකඟතාවය හිමි වන ලදී.**

03. ජී.කේ. නන්දන උපුල්, දියකිතුල්කන්ද, වත්තෙහේන, තල්ගස්වල විසින් යොමු කරන ලද කොවිඩ් 19 දෙවැනි රැල්ල තුල තල්ගස්වල සති පොළ නොපවැත්වීම මත බදු මුදල් කපා හැරීමට අදාළ 2021.12.26 දිනැති ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

04. ඕ.වී.හසිත් කාවින්ද මයා, ඇගලුම් කම්හල අසළ, මානම්පිට , තල්ගස්වල විසින් යොමු කරන ලද කොවිඩ් 19 දෙවැනි රැල්ල තුල උඩුගම සදුදා සති පොළ නොපවැත්වීම මත බදු මුදල් කපා හැරීමට අදාළ 2021.12.30 දිනැති ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**මින් ඉදිරියට ඉහත පොළවල් පවත්වන දිනයන්හිදී අධීක්ෂණ කටයුතු සඳහා සභාවේ ආදායම් පරීක්ෂක නිලධාරී සම්බන්ධ කිරීමටත්, ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද දිනයන්හිදී බදු මුදල් නිදහස් කිරීමටත්, අනෙකුත් දිනයන්හිදී පොළ පැවැත්වූවා නම්, 50% ක මුදලක් ලබා ගැනීමට තීරණය විය.**

05. කේ.කොරලගේ ප්‍රකාශන, සුදුවැලිපොත, උඩුගම, ගාල්ල විසින් පුස්තකාලයට පොත් ලබා ගන්නා ලෙස 2021.01.18 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

06. කෝබ්‍රා කිංග් ක්‍රීඩා සමාජය, තල්ගස්වල විසින් ක්‍රීඩා පිටිය සකස් කර ගැනීම සඳහා දින 02 කට ප්‍රමාණවත් වන පරිදි ජේ.සී.බී. යන්ත්‍රයට අවශ්‍ය ඉන්ධන සපයා දෙන ලෙස 2020.12.23 දිනැතිව යොමු කරන ලද ඉල්ලීමේ ලිපිය සභාගත කරන ලදී.

07. නාගොඩ ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු රියදුරු, බී.ජී.පියතිලක මයා, රියදුරු, අනුර දිසානායක මයා, රියදුරු, එම්.ඒ.වසන්ත මයා, කා.කා.ස. කේ.කේ.අවන්ත පද්ම මයා, කා.කා.ස. යූ.වී.මධුර ප්‍රභාත් මයා, කා.කා.ස. ඩබ්.ඒ.සී. මධුෂානි මිය විසින් නිල ඇඳුම් දීමනාව ලබා ගැනීම සඳහා 2020.01.06 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපි සභාගත කරන ලදී.

08. ඩබ්.ඒ.කේ.අජිත් වසන්ත කුමාර මයා, ආදර්ශගම, ඇතුමලේ, මාපලගම විසින් මුඩුක්කු සංහාරක නිවෙස පවරා ගැනීම සම්බන්ධව 2020.12.23 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**මුල් අයිතිකරුට දිවුරුම් ප්‍රකාශයකින් හෝ වෙනත් ක්‍රමයකින් වෙනත් පාර්ශවයකට පැවරිය නොහැකි බවත් එය නීති විරෝධී ක්‍රියාවක් බැවින් මුල් අයිතිකරුට එරෙහිව නීතිමය පියවර ගැනීමට තීරණය විය.**

09. විජේතුංග ශෘප් පුද්ගලික සමාගම, පෙට්ටිගලවත්ත, ගාල්ල විසින් ටයර් නැවත පිරවීමේ මිළ ගණන් වෙනස්වීම සම්බන්ධව 2021.01.09 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**මුලින් මිල ගණන් කැදවා සිදු කළ කටයුත්තක් බැවින් පැරණි මිල යටතේ ගෙවීම් සිදුකළ යුතු බවත් නව මිල යටතේ ගෙවීම් සිදු නොකල යුතු බවටත් තීරණය විය**

10. නාගොඩ ප්‍රාදේශීය සභාවේ සංවර්ධන සැළැස්ම -2021 සභාගත කරන ලදී

11. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත් විසින් දකුණු පළාත් සංවර්ධන සැළැස්ම - 2020, උපමාන පාදක සංවර්ධන ප්‍රදාන අවිච්ඡේද පසුගාමී පළාත් පාලන ආයතන බල ප්‍රදේශ සඳහා වූ විශේෂ වැඩසටහන, නාන තොටුපල සංවර්ධනය කිරීම යන මැයෙන් 2021.11.04 දිනැතිව අංක 066246 දරණ චෙක්පත යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

12. බුද්ධිල සුසන්ත නාගොඩවිතාන මයා, ආදර්ශගම, ගා/ඇතුමලේ විසින් මාර්ගය අවහිරවීම සම්බන්ධව යොමු කරන ලද 2021.01.19 දිනැති ලිපිය සභාගත කරන ලදී.

13. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් උඩවැලිවිටියතලාව ප්‍රධාන මාර්ගය සුද්ධ කිරීමේ ශ්‍රමදානය සම්බන්ධව 2021.01.19 දිනැතිව යන්ත්‍ර සූත්‍ර හා අවශ්‍ය පහසුකම් සපයා දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

14. යූ.ජී.රංජිත් උදය කුමාර, වැඩ ක්ෂේත්‍ර කම්කරු, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් සභා වාර්තාව බෙදා දීම සඳහා ගමන් කිරීමේදී භාවිතා කරන යතුරු පැදියට අවශ්‍ය ඉන්ධන ලබා ගැනීම සම්බන්ධව 2021.01.19 දිනැතිව යොමු කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යොමු කරන ලද ප්‍රශ්න**

01. ඌරල අක්කර 25 මාර්ගයේ ගමනාගමනයට බාධාවන පරිදි එක් පුද්ගලයකු විසින් මාර්ගය වැසෙන සේ පස් දැමීම සම්බන්ධව ක්‍රියා මාර්ගයක් ගත්තාද? එය කුමක්ද?

    මේ ප්‍රශ්නයට මීට පෙර අවස්ථා කීපයකදි පිළිතුරු දීල තියෙනවා. අදාල ස්ථානය පරීක්ෂා කරන්න තාක්ෂණ නිලධාරි යවල නිර්දේශ ලබාගෙන අදාල පාර්ශවයන් දැනුවත් කර ඇත. 2020.09.07 සුනිල් නැමැති අයට ප්‍රාදේශීය සභා මාර්ගයට අනවසරයෙන් දමන ලද පස්වලින් අඩක් ඉවත් කර ගමනාගමනයට ඇතිවන බාධා දින තුනක් ඇතුලත ඉවත් කරන ලෙස දන්වා ලිපියක් යොමු කර ඇත. අපි මේ කටයුත්තෙදි ලිඛිතව නීත්‍යානුකූලව අදාල පාර්ශවයට දැනුම් දුන්නා. ඔවුන් වරද පිළිගත්තා. මෙතන දෙපාර්ශවයක් අතර තියෙන ගැටුමක්. එක පාර්ශවයක් හරියි කියනවා. අනිත් පාර්ශවය වැරදියි කියනවා. නමුත් එතන වරදක් වෙලා තියෙනවා. පරණ කොන්ක්‍රීට් එක උඩින් පාරෙ පස් දාලා තියෙනවා. නමුත් ඒ කොන්ක්‍රීට් එක අබලන් තත්වෙට පත්වෙලා තියෙන්නෙ. නමුත් ඒක වරදක්. අපි මේ පස් දැමීම අනුමත කරන්නෙ නැහැ. මේක සම්පූර්ණ වරදක්. මේ සඳහා අපි ක්‍රියාමාර්ග අරගෙන තියෙනවා.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. නාගොඩ ප්‍රාදේශීය සභාව සතු ජල බවුසර් මාර්ග සංවර්ධන අධිකාරිය සහ වෙනත් ආයතන වෙත කුලී පදනම මත ලබා දීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

02. ගරු මන්ත්‍රී මණ්ඩලයේ සමූහ ඡායාරූපය රාමුකර ලබා දීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදූසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

03. උඩුගම සති පොළ සංවර්ධන කටයුතු ඍජු ශ්‍රමික පදනම මත සිදු කරන බැවින් වැඩ කරන කම්කරුවන් සඳහා කම්කරු කුලීය හා අවස්ථානුකූලව අවශ්‍ය කරන අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා රු. 100000.00 ක අත්තිකාරම් මුදලක් ලබා ගෙන ගෙවීම් කටයුතු කිරීම සුදුසු බව යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

04. කුරුපනාව අලවත්තවිල මාර්ගය යා කරන (කෙටි මාර්ගය මරනාධාර සමිතිය අසළ සිට) පස් දමා ගොඩ කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

05. සෑම කොට්ඨාසයකම ශ්‍රමදාන මට්ටමින් මාර්ග එළි පෙහෙලි කර ගැනීම සඳහා මාසිකව ශ්‍රමදානයක් සංවිධානය කිරීමට කොට්ඨාස මන්ත්‍රීවරුන් මැදිහත් වී අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

06. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මන්ත්‍රී කොට්ඨාස 15 හි සංවර්ධන කටයුතු සඳහා එක් කොට්ඨාසයකට රු. ලක්ෂ 02 බැගින් ලබා දීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

07. යූ.ජී.රංජිත් උදය කුමාර මහතා සභා වාර්තා බෙදා දීම සඳහා ඔහුගේ පෞද්ගලික යතුරු පැදිය භාවිතා කරන බැවින්, ඒ සඳහා අවශ්‍ය වන ඉන්ධන ලබා දීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

08. 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සිව් අවුරුදු සැළැස්ම සකස් කිරීමට අවශ්‍යාව ඇති බැවින් 2022 වසරේ සිට ඉදිරි වසර 03 දක්වා ක්‍රියාත්මක කල යුතු සංවර්ධන යෝජනා ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීවරුන්ට යෝජනා කරමි. (2021 වර්ෂයේදී අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට නියමිත වේ)

**ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**09. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 54 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**<u>2021.01.19 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2020 දෙසැම්බර් මස විදුලි බිල්පත්**

4591713210 - ප්‍රධාන කාර්යාලය - රු 9471.40
8617046104 - උඩුගම බහුකාර්‍ය මධ්‍යස්ථානය - රු. 734.10
4594192319 - උඩුගම උප කාර්යාලය - රු. 1264.80
4509082800 - උදාර පෙර පාසල - රු. 240.00
8619142704 - රන්කැකුළු පෙර පාසල - රු. 240.00

**2020 නොවැම්බර් මස විදුලි බිල්පත්**
2810125104 - දීප්ති පෙර පාසල - රු. 240.00
8619142704 - රන්කැකුළු පෙර පාසල - රු. 240.00
4507357802 - සමනල පෙර පාසල - රු. 240.00
4593739918 - මාපලගම උප කාර්යාලය - රු. 862.20
8616374000 - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් - රු. 240.00
8616373802 - උඩුගම පොළ - රු. 240.00
4599064300 - ගෝණදෙනිය පෙර පාසල - රු. 240.00
2813189405 -තල්ගස්වල පෙර පාසල - රු. 240.00
2809093105 - කොම්පෝස්ට් ව්‍යාපෘතිය - රු. 2106.60
2810236100 -මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගණය - රු. 240.00

**02. 2020 දෙසැම්බර් මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
i. 0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 5348.73
ii. 0912296537 - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම - රු. 3395.16
iii. 0912296577 - මාපලගම උප කාර්යාලය - රු. 433.23

**2020 නොවැම්බර් මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
iv. 0912296537 - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම - රු. 3664.61
v. 0912296433 - ප්‍රධාන කාර්යාලය - රු. 4892.21
vi. 0912296577 - මාපලගම උප කාර්යාලය - රු. 498.98

**03. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම 091-5701722

(2020.11.16- 2020.12.15) - රු. 612.99

**04. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2020.11.25) - රු. 61.30

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2020.12.25) - රු. 61.30

**05.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය (2020.11.20 – 2020.12.21) -රු. 4494.78

33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2020.11.201- 2020.11.21) -රු. 9467.02

**06 .2020 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 5320.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**07. 2021 ජනවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1750.00 |
| ඩබ්.ඒ.සී.මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 540.00 |

**2020 දෙසැම්බර් මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | - රු. 3000.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1482.00 |
| එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මිය | - කළමනාකරණ සහකාර | - රු. 510.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 7570.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1750.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 470.00 |
| යූ.වී මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 700.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 350.00 |

**08. අතිකාල දීමනා ගෙවීම්**

**2020 දෙසැම්බර් මස**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.04 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 5408.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8500.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 6885.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 6066.48 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 5052.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2491.98 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 6339.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 8707.16 |

| | | |
|---|---|---|
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - අනියම් විදුලි කාර්මික | - රු. 1995.00 |
| ජී.එල්. උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2113.96 |
| කේ.එච්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - අනියම් රියදුරු | - රු. 8596.00 |
| කේ.පී.ජී. ප්‍රසන්න මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3437.28 |
| අයි.කේ.ඉන්දික කුමාර මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 4326.00 |
| යූ.ජී. රංජිත් මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1770.00 |
| එම්.එම්.මහින්දදාස මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 4495.00 |
| හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 4313.20 |
| ඩී. සමන් ප්‍රදීප් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 7871.85 |

**09. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

| | | |
|---|---|---|
| i. | 2020 දෙසැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත | - රු. 78000.00 |
| ii. | පීඑෆ් 7360 දරණ කැබ් රථය දුම් පරික්ෂාවට ලක් කිරීම හා ආදායම් බලපත්‍රය අලුත් කිරීමේ වියදම් මුදල් ප්‍රතිපූර්ණය කිරීම | - රු. 10130.00 |
| iii. | සංග්‍රහ වියදම් දීමනාව අලුත් කිරීම | - රු. 4000.00 |
| iv. | සුළු මුදල් අග්‍රිමය අලුත් කිරීම | - රු. 5000.00 |
| v. | නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ තීන්ත ආලේප කිරීමට අදාළව යූ.ජී. සඳුන් කුමාර මයාගේ වැඩ කුලිය ගෙවීම | - රු. 9250.00 |
| vi. | 2020.12.30 දින පවත්වන ලද තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිලධාරීන් සඳහා හිමි දීමනා ගෙවීම | - රු. 3500.00 |
| vii. | PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම | - රු. 2300.00 |
| viii. | නාගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතාගේ නිවසේ සාමාජිකයින් කොවිඩ් ආසාධනය වීම හේතුවෙන් නිරෝධායනයට ලක්වූ නිවසට වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීමේ ප්‍රජා සත්කාරය සඳහා වියදම් වූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම | - රු. 5001.85 |
| ix. | උඩුගම සතිපොළ කඩකාමර ඉදිකිරීම 1 අදියර කර්මාන්තයේ සේවක වැඩ කුලිය ගෙවීම | - රු. 59350.00 |
| x. | PF 7360 වාහනය පවරා ගැණීමෙන් අනතුරුව ලියාපදිංචි සහතිකය ලබා ගැනීමේදී මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය වෙත ලදුපත් අංක A 6267041 මගින් ගෙවන ලද මුදල් ප්‍රතිපූර්ණය කිරීම | - රු. 8930.00 |

**10. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2020 දෙසැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 591ක් | - රු. 61464.00 |
| A252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 315 ක් | - රු. 32760.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 225 ක් | - රු. 23400.00 |
| LL 7366 ට්‍රක් බවුසර් රථය ඩීසල් ලීටර් 100 ක් | - රු. 10400.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 160 ක් | - රු. 16640.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 33 ක් | - රු. 3432.00 |
| DS 40 Oil | - රු. 1650.00 |
| ගබඩාව පෙට්‍රල් ලීටර් 25 | - රු. 3425.00 |
| 2T Oil ලීටර් 1 | - රු. 620.00 |
| පවර් ස්ටීරියන් ඔයිල් | - රු. 1015.00 |
| **එකතුව** | **- <u>රු.154806.00</u>** |

**11. බී.ජේ. කරුණාරත්න මයා, රත්නගිරි ස්ටෝර්ස් , මාපලගම**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

2020 නොවැම්බර් - රු. 5120.00
2020 දෙසැම්බර් - රු. 4870.00

**12. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 දෙසැම්බර් - රු. 5470.00

**13. එම්.ඒ. සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2020 ඔක්තෝම්බර් - රු. 2340.00
2020 නොවැම්බර් - රු. 2540.00
2020 දෙසැම්බර් - රු. 2510.00

**14. සඳුන් චතුරංග මයා, ඊබේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම**

i. ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ පරිගණක යන්ත්‍රවලට අදාළ ප්‍රින්ටර් සඳහා ටෝනර් 04 ක් ලබා ගැනීමේ බිල්පත - රු.39000.00
ii. LBP Canon ප්‍රින්ටරයක් ලබා ගැනීමේ බිල්පත - රු.17500.00

**15. ධම්මික ලී මෝල සහ වෙළඳසැල**
ඇලස්ටෝනියා කඳන් 2 ක් දැව ලෙස ඉරා ගැනීමේ බිල්පත - රු. 4590.00

**16. උපාලි නිව්ස්පේපර්ස් පුද්ගලික සමාගම, කොළඹ**

i. 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ දැන්වීම 2020.11.20 දින දිවයින පත්‍රයේ පළ කිරීම සඳහා ගාස්තු ගෙවීම - රු. 28350.00
ii. 2021 වර්ෂයට වාර්ෂික දේපල බදු දීම සම්බන්ධ දැන්වීම (සති පොළ) 11.20 දින දිවයින පුවත්පතෙහි පළ කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම - රු. 20412.00

**17. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
ප්‍රධාන කාර්යාලයේ අළුත්වැඩියා කටයුතු සඳහා පින්සල් ලබා ගැනීමේ බිල්පත - රු. 2425.00

**18. ජෝන්කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ 02**
ඡායා පිටපත් යන්ත්‍රයේ වාර්ෂික සේවා ගිවිසුම සඳහා මුදල් ගෙවීම - රු.18003.14

**19. සුභා ට්‍රාන්ස්පෝට්, උඩුගම දකුණ**
උඩුගම සතිපොළ නව කඩ කාමර ඉදිකිරීම් කර්මාන්තයට අදාළව වලවල් තැනීම සඳහා එක්ස්චේටර් යන්ත්‍රයක් යොදා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 8190.00

**20.දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ**

i. වැටුපෙන් අයකරගත් මුද්දර බදු හා බලපත්‍ර ගාස්තු ලෙස අය කල 10% මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශනය කිරීම (2020.10.01-2020.12.31 දක්වා) - රු. 8475.00
ii. වැටුපෙන් අයකරගත් මුද්දර බදු හා බලපත්‍ර ගාස්තු ලෙස අය කල 10% මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශනය කිරීම (2020.07.01-2020.09.30 දක්වා) - රු. 7175.00
iii. වැටුපෙන් අයකරගත් මුද්දර බදු හා බලපත්‍ර ගාස්තු ලෙස අය කල 10% මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේශනය කිරීම (2020.04.01-2020.06.30 දක්වා) - රු. 5175.00

**21. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ජනවාරි මස මාසික කුලිය ගෙවීම - රු. 5000.00

**22. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

i. ප්‍රධාන කාර්යාලයේ තීන්ත ආලේප කිරීම සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත - රු.85605.00
ii. තල්ගස්වල සති පොළේ විදුලි අළුත්වැඩියාව සඳහා අවශ්‍ය උපාංග මිළදී ගැනීම - රු. 2310.00
iii. තල්ගස්වල ප්‍රාදේශීය සභා පෙර පාසලේ විදුලි අළුත්වැඩියාව සඳහා උපාංග මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 1710.00
iv. ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත් ( සිමෙන්ති, කම්බි....) - රු. 1685.00

**23. පී.එම්.චමින්ද ලක්මාල් මයා, මත්තක**

ප්‍රධාන කාර්යාලයේ මේස රෙදී මැසීමේ බිල්පත (රෙදි සමඟ) - රු.43480.00

**24. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**

i. ප්‍රාදේශීය සභාවේ 2020.12.08 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 4885.00

**25. කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්, යක්කලමුල්ල**

i. වීථි පහන් උපාංග ලබා ගැනීමේ බිල්පත - රු. 12607.25
ii. වීථි පහන් උපාංග ලබා ගැනීමේ බිල්පත - රු. 45500.00

**26. ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විස්, මාපලගම**

i. LL 7650 දරණ කෘ කැබ් රථයේ ටයර් මාරු කර රිම් ටේප් පතක් දැමීමේ බිල්පත පියවීම - රු. 1550.00
ii. 252-6478 දරණ කැබ් රථයේ ඩීසල් හෝස් එක සහ ක්ලිප් එක අලුතින් දැමීමේ බිල්පත - රු. 975.00
iii. LL 7103 ටිපර් රථය සෝදා තෙල් ඇල්ලීමේ බිල්පත - රු. 2550.00

**27. හේමසිරි නානායක්කාර මයා, හෝකන්දර**

නාගොඩ ප්‍රාදේශීය සභා පුස්තකාල 03 සඳහා මිළදී ගත් පොත් සඳහා ගෙවීම් - රු. 1350.00

**28. ජයන්ත ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, බෙලිගහ**

පෙර පාසල් ළමුන් සඳහා සහතික පත් මුද්‍රණය කිරීමේ බිල්පත - රු.13000.00

**29. එක්සලන්ට් ඇඩ්ස් ඇන්ඩ් කා කෙයා**

උනන්විටිය පොළ පැවැත්වීම සම්බන්ධව බැනරයක් මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 450.00

**30. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පීඑල් සී**

ඡායා පිටපත් යන්ත්‍රය සඳහා ටෝනර් ලබා ගැනීමේ බිල්පත - රු.17280.00

**31. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

i. LL 7650 කෘ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.16630.00
ii. PF 7360 දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.23370.00

**32. ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල**

නාගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය අඩි 6 x අඩි 4 ප්‍රමාණයෙන් ප්‍රින්ට් කිරීම සහ රාජ්‍ය ලාංඡනය ප්ලාස්ටික් වලින් සෑදීමේ ගාස්තු - රු. 42000.00

**33. එල්කාඩෝ ට්‍රේඩිං ප්‍රයිවට් ලිමිටඩ්, නාවල**
PF 7360 දරණ කැබ් රථයේ කැනපි එකේ දෙපැත්තේ ලොක් දෙක අලුතින්
සවි කිරීමේ බිල්පත - රු. 5000.00

**34. ප්‍රධාන සංවිධායක චම්පික හිරිමුතුගොඩ මයා, උරුමය පදනම, මාපලගම**

i. 2020.04.10 සිට 2020.04.12 දින දක්වා මාපලගම මහජන ක්‍රීඩාංගනයේ පැවැත්වීමට නියමිතව තිබූ අවුරුදු පොළ සහ විනෝද ක්‍රීඩා සැණකෙළිය කොවිඩ් වසංගතය හේතුවෙන් නොපැවැත්වීම නිසා ඒ සඳහා ගෙවීම් කරන ලද ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ගාස්තු ආපසු ලබා දීම - රු. 4500.00

ii. 2020.04.10 සිට 2020.04.12 දින දක්වා මාපලගම මහජන ක්‍රීඩාංගනයේ පැවැත්වීමට නියමිතව තිබූ අවුරුදු පොළ සහ විනෝද ක්‍රීඩා සැණකෙළිය කොවිඩ් වසංගතය හේතුවෙන් නොපැවැත්වීම නිසා ඒ සඳහා ගෙවීම් කරන ලද විදුලිය තැන්පතු ගාස්තු ආපසු ලබා දීම - රු. 5000.00

**35. සදෙව් මෝටර්ස් ඇන්ඩ් සර්විස් සෙන්ටර්, උඩුගම**
ප්‍රෙශර් ගන් එක අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 10500.00

**36. විගණකාධිපති, විගණන කාර්යාලය**

i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**37. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, වදුරඹ**

i. පී එෆ් 7360 කැබ් රථයේ බ්‍රේක් පද්ධතියේ දෝෂය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 7100.00
ii. 252-6478 දරණ කැබ් රථයේ බ්‍රේක් පද්ධතියේ දෝෂය නිවැරදි කිරීමේ බිල්පත - රු. 6050.00
iii. පී.එෆ් 7360 දරණ කැබ්රථයේ දුනුකොළය අලුතින් දමා සෑදීමේ බිල්පත - රු. 5100.00

**38. නිව් කාන්ති ටයර් සර්විස්, නාගොඩ**
RA 8569 දරණ ට්‍රැක්ටරයේ වම්පස ටයරයේ ටියුබ් සහ රිම්ටේප් අලුතින් සවි කිරීමේ
බිල්පත - රු. 3150.00

**39. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2020 දෙසැම්බර්) - රු.13000.00

**40. සවුත්නෙට් ටෙක්නොලොජි, ගාල්ල**
Hp Laserjet ගිණුම් අංශයේ ප්‍රින්ටරය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 4750.00

**41. කාන්ති නාගොඩවිතාන මිය, කාන්ති ටයර් සර්විස්, නාගොඩ**
650x16 ටයර් 04 ක් ඩැග් කිරීමේ බිල්පත පියවීම - රු. 18800.00

**42. යුනයිටඩ් ෆාමා, ගාල්ල**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ විෂබීජහරණ කටයුතු සඳහා අත්සේදුම් දියර සහ
විෂබීජනාශක දියර ලබා ගැනීමේ බිල්පත - රු. 5000.00

43..ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කම්යුනිකේෂන්

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 දෙසැම්බර් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

ii. 2020 දෙසැම්බර් මස සහා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු.3675.00

**44. දසමස් වැටුප් අත්තිකාරම්**

i. කුසල් අසංක එදිරිසිංහ මයා - රු.250000.00

**45. සෙල් එක්ස් කම්පියුටර්, ගාල්ල**

උඩුගම උප කාර්යාලයේ ඇඟිලි සළකුණු යන්ත්‍රයේ power adapter එක අලුතින් යෙදීමේ බිල්පත -රු. 1500.00

**46. ආර්.පී.කේ.අබේසිංහ මයා, යටලමත්ත**

නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ තීන්ත ආලේප කටයුතු සඳහා බදු පදනම මත පලංචි උපකරණ ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 2700.00

**47.නීතීඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**

i. 2020.12.14 දින කැඳවූ එල් 36 දරණ උඩුගම දිසා අධිකරණයේ පැවති නඩුවට අදාළව නීතීඥ හා පෙනී සිටීමේ, - රු. 5000.00
ii. 2020.12.10 දින කැඳවූ එස් පී 138 දරණ නඩුවට අදාළව වෙනුවෙන් නීතීඥ හා පෙනී සිටීමේ, ගාස්තු - රු. 5000.00
iii. 2020.11.25 හා 2020.12.16 දිනවලට අදාළව බද්දේගම දිසා අධිකරණයේ පැවති නඩුවලට නීතීඥ හා පෙනී සිටීමේ, - රු.10000.00

**48. විජේතුංග ගෲප් ප්‍රයිවට් ලිමිටඩ්, ගාල්ල**

ට්‍රැක්ටරයේ මහා රෝද දෙක ඩැග් කිරීමේ බිල්පත
(මිළ ගණන් කැඳවීමට වඩා මිළ ගණන වැඩි වී ඇත.
ලබා දී ඇති මිළ ගණන් අනුව ගෙවීමට තීරණය විය) - රු. 22780.00

**49. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව , කොළම**

ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය සහ විධායක නිලධාරීන්ට කළමනාකරණ සේවා දිනපොත් ලබා ගැනීමේ බිල්පත - රු. 17400.00

**පොදු අරමුදල් කර්මාන්ත**

**50. සී/ස බද්දේගම බටහිර ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, බද්දේගම**
**පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමා**

i. මලාමුර මැදගොඩහේන මාර්ගය සඳහා සිළිංඩර් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම - රු. 42625.00
ii. උඩුගම සතිපොළ සංවර්ධනය කිරීම සඳහා මිළදී ගත් Y කණු සඳහා ගෙවීම් කිරීම - රු.149850.00

**51. විකුම් කන්ට්‍රක්ෂන්, උඩුගම**

උඩුගම සතිපොළ සංවර්ධනය කිරීමට අදාළව මිළදී ගත් කොන්ක්‍රීට් ගල් හා වැලි සඳහා ගෙවීම් සිදු කිරීම - රු. 30500.00

**රජයේ ආධාර**

**පළාත් නිශ්චිත**
52. ඌරල පහළ අක්කර 25 222 සී ග්‍රාම නිලධාරී වසමට අයත් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම කර්මාන්තයේ ගෙවීම් සිදු කිරීම -රු.875934.30

**දකුණු පළාත් සංවර්ධන සැළැස්ම - 2020**
53. ගම්මැද්දේගොඩ දකුණ බන්දුල විජේසේකර මාවත කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයට අදාළ මුදල් ගෙවීම - රු.447966.01

**54. මාපලගම ග්‍රාම සංවර්ධන සමිතියේ ලංකා බැංකුවේ ග්‍රාම සංවර්ධන සමිති ශාලාව**
මාපලගම රණවිරුගම සුභසාධක සමිතිශාලා භූමියේ පැති බැම්ම ඉදිකිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම - රු.450000.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ අක්කර 80 ගම්මානයේ ඉදි කර ඇති ප්‍රජා ශාලා ගොඩනැගිල්ල රජයේ කාර්යාල පවත්වා ගැනීමට හැකි වන අයුරින් මැනවින් නඩත්තු කර අදාළ කටයුතු සිදු කිරීම හෝ එසේ නොමැතිනම්, ප්‍රාදේශීය ලේකම්ට පවරා දී හෝ රජයේ කාර්යාල පවත්වා ගෙන යාමට අවස්ථාව සළසා දෙන ලෙස යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. උඩුගම මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බූලිස්කන්ද ගම්මානය කදු මුදුනක පිහිටා ඇති බැවින් එම ගම්මානය සඳහා ප්‍රවේශ වීමට මාර්ගයක් නොමැති වීම එම ගම්වැසියන් මුහුණ දෙන දැවෙන ප්‍රශ්ණයකි. එබැවින් එම ගම්මානයට ප්‍රවේශ වීම සඳහා මාර්ගයක් කඩිනමින් සකස් කර දෙන ලෙස යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. උඩුගම මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ සිරි සීලවංශ මාවතේ පළමුවන පටුමඟ ඔස්සේ ගම්මානවලට ලගා වන ගම්වැසියන්ට එම මාර්ගය භාවිතා කිරීමේදී ගැටළු රැසකට

මුහුණ දීමට සිදු වී ඇත. එම මාර්ගය නිරවුල් කර භාවිතා කල හැකි පරිදි සභා කම්කරුවන් යොදවා හෝ සකස් කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. උඩුගම දකුණ ප්‍රාදේශීය සභා පෙර පාසල අසළ දිවා රාත්‍රී ක්‍රීඩා කල හැකි අංග සම්පූර්ණ අත්පන්දු ක්‍රීඩා පිටියක් ඉදි කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. උනන්විටිය කොට්ඨාසයේ උනන්විටිය නැගෙනහිර 211 බී ග්‍රාම සේවා වසමට අත්පන්දු ක්‍රීඩා පිටියක අවශ්‍යතාවයක් පවතී. එබැවින්, එම ග්‍රාම සේවා වසමට අත්පන්දු ක්‍රීඩා පිටියක් ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී නිහාල් වසන්ත පතිනායක මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. ඌරල ක්‍රීඩාංගනයට අඩුපාඩුවක් ලෙස පවතින අත්පන්දු ක්‍රීඩාපිටිය දිවා රාත්‍රී ක්‍රීඩා කල හැකි වන පරිදි විදුලි ආලෝකය සමඟ, අවට ආවරණය සහිත වූ අංග සම්පූර්ණ අත්පන්දු ක්‍රීඩා පිටියක් ලෙස සකස් කර දෙන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී නිහාල් වසන්ත පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය ඉදිරිපත් කරන යෝජනා**

01. 217 ඒ ගම්මැද්දේගොඩ උතුර පිහිටි ක්‍රීඩා පිටිය සඳහා රාත්‍රී අත්පන්දු ක්‍රීඩා පිටියක් ඉදි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. කුඹුරුහේන නාවින්න ගොරොක්ගස්තුඩුව ප්‍රදේශවලට සුසාන භූමියක් නොමැති නිසා සුසාන භූමියක අවශ්‍යතාවය පවතින බැවින් ඒ සඳහා කුඹුරුහේන නො.20 ප්‍රදේශයේ මේ

සඳහා සුදුසු ඉඩමක් පවතින බැවින්, එම ඉඩම සුසාන භූමියක් ඉදිකිරීම සඳහා පවරා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නදීකා දර්ශනී මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ඉදිරිපත් කරන යෝජනා**

01. කැප්පිටියාගොඩ ප්‍රදේශයේ දූ දරුවන්ගේ ක්‍රීඩා කුසලතාවය වර්ධනය කර ගැනීම සඳහා ක්‍රීඩා පිටියක අවශ්‍යතාවය පවතී. ඒ සඳහා අවශ්‍ය භූමිය නාගොඩ වතුයායේ පාලකතුමා සමඟ සාකච්ඡා කර, ලබා ගැනීමට සියළු කටයුතු සූදානම් කර ඇත. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දී ප්‍රදේශයේ දූ දරුවන් වෙනුවෙන් දායකත්වය ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. කැප්පිටියාගොඩ දකුණ ග්‍රාම සේවා වසමට අයත්, සභාව සතු ප්‍රජා ශාලාවෙහි පෙර පාසලක් සහ සමෘද්ධි වැඩසටහන් යටතේ සමිති පවත්වා ගෙන යයි. එම ප්‍රජා ශාලාව සඳහා විදුලිය ලබා ගැනීම සමෘද්ධි බලකාය යටතේ සිදු කර ඇත. එම විදුලිබිල සභාව සතු විදුලි බිලක් ලෙස වෙනස් කිරීමටද, එසේම එහි පවත්වා ගෙන යනු ලබන පෙර පාසල සභාවේ නීතිරීතිවලට අනුකූලව පවත්වාගෙන යාම සම්බන්ධව අවධානය යොමු කොට කටයුතු කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. උඩවැලිවිටිය බටහිර ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල මුක්තවිල මාර්ගය කොරි පස් දමා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. 214 ඊ කැටගොඩ දකුණ සමෘද්ධි මාවත කොරිපස් හෝ ඒබීසී දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් මදූසංක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. 214 ඩී මාරකන්ද නව ගම්මාන මාර්ගය ජේසීබී යන්ත්‍රයක් යොදා කාණු කපා බෝක්කු දමා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ගයාන් මදූසංක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. 214 ඒ මලාමුර 37 කන්ද සිට නාවින්න දක්වා මාර්ගය ජේසීබී යන්ත්‍රයක් යොදා බෝක්කු දමා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ගයාන් මදූසංක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. 214 ඒ මලාමුර වෙදගෙදර මාවත ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ගයාන් මදූසංක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. 214 බී කැටගොඩ උතුර ඇල්ලවත්ත මාර්ගය ජේ.සී.බී.යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ගයාන් මදූසංක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. 214 සී අලුත් ඉහළ දකුණ පීල්ල ඉහළ අතුරු මාර්ගයේ ඉතිරිව ඇති මීටර් 30 ක ප්‍රමාණය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී ගයාන් මදූසංක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක වන ගෝණදෙනිය පෙර පාසල ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන පෙර පාසලක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. 215 අලුත් පහළ නො.20 4 වන පටුමහ දෙපස කාණු කපා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

02. 215 ඒ මාපලගම රණවිරුගම කොස්ගහ බංගලාව පාර දෙපස කාණු කපා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

03. 215 සී තල්ගස්වල කළුකොත මානම්පිට පාර දෙපස කාණු කපා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

04. 215 සී තල්ගස්වල දියවරගම I මාර්ගයේ සිට II මාර්ගයේ පිවිසුම දක්වා දෙපස කාණු කපා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

05. 215 සී තල්ගස්වල රාජ්‍ය වැවිලි සංස්ථාව මැද කොටසේ පිහිටි ක්‍රීඩා පිටිය පිළිසකර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

06. 215 බී අලුත්පහළ බටහිර ගොරොක්ගස්තුඩුව, කළුවැල්දෙනිය ඉහළ කොටස දෙපස කාණු කපා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

07. 215 බී අලුත් පහළ බටහිර නාවින්න වැව මායිම් මාර්ගය දෙපස කාණු කපා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

08. සියළු උපාංග සහිත වීථි ලාම්පු 20 ක් කොට්ඨාසයේ ගම් වැසියන් ඉල්ලුම් කරන ලද ස්ථාන සඳහා සවි කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මදුසංක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. හෝමදොල මැණික් කඩය අසළ ප්‍රජා ශාලාව සඳහා රු. 100000.00 ක මුදල් ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙස යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

02. හෝමදොල 65 මාර්ගය ජේ.සී.බී. කිරීම සඳහා රු. 50000.00 ක මුදල් ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙස යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

03. හෝමදොල හිල් සයිට් කන්ද පාර ජේ.සී.බී. කිරීම සඳහා රු. 25000.00 ක මුදල් ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙස යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

04. ජනඋදාන ගම්මානය මැද පාර ජේ.සී.බී. කිරීම සඳහා රු. 25000.00 ක මුදල් ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙස යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

05. අතුරු මාර්ග කිහිපයක අනතුරුදායක ස්ථානවලට දැමීම සඳහා වීථි ලාම්පු 25 ක් ලබා ගැනීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ඉදිරිපත් කරන යෝජනා**

01. සඳරුස්ගම 59 හේන වතු මාර්ගය කාණු කපා, මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

02. සඳරුස්ගම බටහේන්ගොඩ මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

03. කුරුන්ද දාවුල්හේන මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම සහ නාමල් මහතාගේ නිවස අසළ ඇති බෝක්කුව පිළිසකර කිරීම
**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. අතුරු මාර්ග කිහිපයක පවතින අනතුරුදායක ස්ථාන සඳහා වීජී ලාම්පු 20 ක් ලබා ගැනීම
**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. උඩවැලිවිටිය බටහිර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම - රු. 37000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තුව සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ වැලි ගල් මිලදී ගැනීම සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| **විස්තරය** | **චාමර ලක්මාල් පෙරේරා,තල්ගස්වල** | **එල්.කේ.එස්. ලක්මාල්,මාරකන්ද** | **එන්. එච්. ප්‍රියන්ත,මත්තක** | **විකුම් කන්ස්ට්‍රක්ෂන්,උඩුගම** |
|---|---|---|---|---|
| වැලි කියුබ් 01 | 13500.00 | 13800.00 | 14000.00 | 13500.00 |
| ගල් ½ කියුබ් 01 | | | | 8500.00 |
| ගල් 1/4 කියුබ් 01 | 10000.00 | 10500.00 | 11000.00 | 8500.00 |
| ගල් 3/4 කියුබ් 01 | 9500.00 | 9800.00 | 10000.00 | 8500.00 |
| බඹ ගල් කියුබ් 01 | 5900.00 | 6000.00 | 6200.00 | 5800.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ වැලි ගල් මිලදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල විකුම් කන්ස්ට්‍රක්ෂන්, උඩුගම විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ගල් මිලදී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. එමෙන්ම වැලි කියුබ් මිළදී ගැනීමේදී අවස්ථානුකූලව හා මිළදී ගන්නා ප්‍රමාණය අනුව චාමර ලක්මාල් පෙරේරා,තල්ගස්වල වෙතින් මිළදී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව විකුම් කන්ස්ට්‍රක්ෂන්, උඩුගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ගල් මිලදී ගැනීම සුදුසු බවත්, වැලි කියුබ් මිළදී ගැනීමේදී අවස්ථානුකූලව හා මිළදී ගන්නා ප්‍රමාණය අනුව චාමර ලක්මාල් පෙරේරා, තල්ගස්වල වෙතින් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ දැව මිලදී ගැනීම සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| <u>විස්තරය</u> | <u>ධම්මික ලී මෝල - උඩලමත්ත</u> | <u>සරත් ගමගේ උඩලමත්ත</u> | <u>රවි ලී මොල - උඩලමත්ත</u> |
|---|---|---|---|
| 2"X2" | 35.00 | 35.00 | 33.00 |

| | | | |
|---|---|---|---|
| 2''x1'' රීප්ප | 12.00 | 12.00 | 10.00 |
| 2''x4'' | 170.00 | 100.00 | 100.00 |
| 3''x4'' | 190.00 | 180.00 | 200.00 |
| 3'x5'' | 260.00 | 230.00 | 270.00 |
| 9'' වඩිම්බු ලෑලි | 110.00 | 120.00 | - |

නාගොඩ ප්‍රාදේශීය සභාවට දැව මිලදී ගැනීම සඳහා ලැබී ඇති මිල ගනන් අනුව අවශ්‍ය 2''x4'', 3''x4'' ප්‍රමාණයේ ඇලස්ටෝනියා දැව අවශ්‍ය ප්‍රමාණය හා අවස්ථානුකූලව සරත් ගමගේ උඩලමත්ත විසින් හෝ රවි ලී මොල - උඩලමත්ත විසින් මිළදී ගැනීම සහ 2''X2'', 2''x1'' ප්‍රමාණයේ දැව සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කල රවි ලී මොල - උඩලමත්ත වෙතින් මිළදී ගැනීමටත්, 3'x5'' ප්‍රමාණයේ දැව සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කල සරත් ගමගේ උඩලමත්ත වෙතින් මිළදී ගැනීමත්, වඩිම්බු ලෑලි මිළදී ගැනීම සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කල ධම්මික ලී මෝල - උඩලමත්ත වෙතින් මිළදී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව 2''x4'', 3''x4'' ප්‍රමාණයේ ඇලස්ටෝනියා දැව අවශ්‍ය ප්‍රමාණය හා අවස්ථානුකූලව සරත් ගමගේ උඩලමත්ත විසින් හෝ රවි ලී මොල - උඩලමත්ත විසින් මිළදී ගැනීම සහ 2''X2'', 2''x1'' ප්‍රමාණයේ දැව සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කල රවි ලී මොල - උඩලමත්ත වෙතින් මිළදී ගැනීමටත්, 3'x5'' ප්‍රමාණයේ දැව සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කල සරත් ගමගේ උඩලමත්ත වෙතින් මිළදී ගැනීමත්, වඩිම්බු ලෑලි මිළදී ගැනීම සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කල ධම්මික ලී මෝල -උඩලමත්ත වෙතින් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ රාජ්‍ය ලාංඡනය සකස්කිරීම හා ඡායාරූප මුද්‍රණය හා රාමුකිරීම සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| <u>රාජ්‍ය ලාංඡනය සකස්කිරීම හා ඡායාරූප මුද්‍රණය හා රාමුකිරීම</u> | <u>රන්ජන් ඇල්බට් ආර්ට්ස් ගාල්ල</u> | <u>රෂ් ඇඩ්ස් - ගාල්ල</u> | <u>උදය ඉන්ඩස්ට්‍රීස් අක්මීමන</u> |
|---|---|---|---|
| රාජ්‍ය ලාංඡනය සකස්කිරීම | 6000.00 | 7000.00 | 7500.00 |
| ඡායාරූප මුද්‍රණය හා රාමුකිරීම | 1950.00 | 2100.00 | 2150.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ රාජ්‍ය ලාංඡනය සකස්කිරීම හා ඡායාරූප මුද්‍රණය හා රාමුකිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල රන්ජන් ඇල්බට් ආර්ට්ස් ගාල්ල විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ රාජ්‍ය ලාංඡනය සකස්කිරීම හා ඡායාරූප මුද්‍රණය හා රාමුකිරීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව රන්ජන් ඇල්බට් ආර්ට්ස් ගාල්ල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ රාජ්‍ය ලාංඡනය සකස්කිරීම හා ඡායාරූප මුද්‍රණය හා රාමුකිරීම සුදුසු බව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ රාමුව සහිත බෝඩ් මුද්‍රණය සඳහා ලැබී ඇති මිල ගනන්</u>

| <u>රාමුව සහිත බෝඩ් මුද්‍රණය</u> | <u>රන්ජන් ඇල්බට් ආර්ට්ස්</u> | <u>රෂ් ඇඩ්ස් - ගාල්ල</u> | <u>උදය ඉන්ඩස්ට්‍රීස් අක්මීමන</u> |
|---|---|---|---|

| | ගාල්ල | | |
|---|---|---|---|
| පලාස්ටික් නාම පුවරු වර්ග අඩියක් | 1500.00 | 1700.00 | 1800.00 |
| ඩිජිටල් නාම පුවරු වර්ග අඩියක් | 600.00 | 800.00 | 850.00 |
| තහඩු නාම පුවරු වර්ග අඩියක් | 1200.00 | 1400.00 | 1500.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ රාමුව සහිත බෝඩ් මුද්‍රණය සදහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල රන්ජන් ඇල්බට් ආර්ට්ස් ගාල්ල විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ රාමුව සහිත බෝඩ් මුද්‍රණය කිරීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව රන්ජන් ඇල්බට් ආර්ට්ස් ගාල්ල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ රාමුව සහිත බෝඩ් මුද්‍රණය සුදුසු බව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි එන්.ඩබ්.පතිනායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ ඇණ වර්ග, තිනර් ආදිය මිලදී ගැනීම සදහා ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ | දයානි ට්‍රේඩ් සෙන්ටර් මාපලගම | ජනක හාඩ්වෙයාර් , නාගොඩ |
|---|---|---|---|
| යකඩ ඇණ කිලෝ 01 | 200.00 | 200.00 | 200.00 |
| කොන්ක්‍රීට් ඇණ කිලෝ 01 | 600.00 | 475.00 | 485.00 |
| ශිට් වොෂර් කිලෝ 01 | 325.00 | 300.00 | 195.00 |
| ශීට් ඇණ කිලෝ 01 | 600.00 | 450.00 | 480.00 |
| තිනර් ලීටර් 1 | 230.00 | 240.00 | 240.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍යා ඇණ වර්ග, තිනර් ආදිය මිලදී ගැනීම සදහා ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ හා අවස්ථානුකූල බව ආදිය සැළකිල්ලට ගනිමින් මිළ ගණන් ඉදිරිපත් කල දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍යා යකඩ ඇණ, කොන්ක්‍රීට් ඇණ, ශිට් වොෂර්, ශීට් ඇණ මිළදී ගැනීම සුදුසු බවත්, තිනර් නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ වෙතින් මිළදී ගැනීම සුදුසු බවත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍යා යකඩ ඇණ, කොන්ක්‍රීට් ඇණ, ශිට් වොෂර්, ශීට් ඇණ මිළදී ගැනීම සහ නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ වෙතින් තිනර් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

<u>නාගොඩ ප්‍රාදේශීය සභාවේ තීන්ත හා ආශ්‍රිත ද්‍රව්‍ය මිලදී ගැනීම සදහා ලැබී ඇති මිල ගනන්</u>

| විස්තරය | නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ | චාමින් හාඩ්වෙයාර් - තල්ගස්වල | දයානි ට්‍රේඩ් සෙන්ටර් - |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| | | | මාපලගම |
| පොටි බැග් 25 කිලෝ<br>05 කිලෝ | 550.00 | 530.00-645.00 | 500.00 |
| වැලි කොල 180 | 80.00 | 70.00 | 80.00 |
| පිලර් 10 ලීටර්<br>4 ලීටර්<br>1 ලීටර් | 2250.00<br>975.00<br>300.00 | 1750.00<br>775.00<br>240.00 | 1750.00<br>775.00<br>300.00 |
| රෝලර් බ්‍රෂ් | 425.00 | 490.00 | 375.00 |
| ඉමල්ෂන් තීන්ත 10<br>ලීටර් 4<br>ලීටර් 1 | 7500.00<br>2700.00<br>900.00 | 7300.00<br>3100.00<br>850.00 | 7120.00<br>3340.00<br>820.00 |
| වෙදර්ෂීල් තීන්ත10<br>ලීටර් 4<br>ලීටර් 1 | 9850.00<br>4200.00<br>1150.00 | 9490.00<br>3750.00<br>1000.00 | 9080.00<br>3790.00<br>995.00 |
| ස්ක්‍රේපර් අගල් 1<br>අගල් 2<br>අගල් 4 | 140.00<br>160.00<br>200.00 | 120.00<br>140.00<br>170.00 | 130 |
| පින්සල් අගල් 1<br>අගල් 2<br>අගල් 4 | 225.00<br>275.00<br>550.00 | 295.00<br>450.00<br>890.00 | 260.00<br>310.00<br>595.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය තීන්ත හා ආශ්‍රිත ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලැබී තිබූ මිල ගණන් අනුව පින්සල් මිළදී ගැනීම සඳහා හොඳම මිල ගණන් ඉදිරිපත් කල නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය පින්සල් මිළදී ගැනීම සුදුසු බවත්, තීන්ත වර්ග, පොටි, වැලි කොළ ආදි අනිකුත් ද්‍රව්‍ය මිළදී ගැනීම සහා අවස්ථානුකූලබව සහ ප්‍රවාහන පහසුව සළකා බලා එම ද්‍රව්‍ය දයානි ට්‍රේඩ් සෙන්ටර් -මාපලගම වෙතින් මිළදී ගැනීම සුදුසු බවත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය පින්සල් මිළදී ගැනීම සුදුසු බවත්, තීන්ත වර්ග, පොටි, වැලි කොළ ආදි අනිකුත් ද්‍රව්‍ය මිළදී ගැනීම සහා අවස්ථානුකූලබව සහ ප්‍රවාහන පහසුව සළකා බලා එම ද්‍රව්‍ය දයානි ට්‍රේඩ් සෙන්ටර් -මාපලගම වෙතින් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.

**නාගොඩ ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘති සඳහා ලැබී ඇති ඇති මිල ගනන්**

| විස්තරය | නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ | චාමින් හාඩ්වෙයාර් - තල්ගස්වල | දයානි ට්‍රේඩ් සෙන්ටර් - |
|---|---|---|---|

| | | | <u>මාපලගම</u> |
|---|---|---|---|
| ඇස්බැස්ටස් ශීට් අඩි 12 | 2400.00 | 2340.00 | 2250.00 |
| ඇස්බැස්ටස් ශීට් අඩි 10 | 1875.00 | 1825.00 | 1825.00 |
| ඇස්බැස්ටස් ශීට් අඩි 08 | 1580.00 | 1570.00 | 1560.00 |
| ඇස්බැස්ටස් ශීට් අඩි 06 | 1150.00 | 1120.00 | 1125.00 |
| ඇස්බැස්ටස් ශීට් අඩි 04 | 550.00 | 560.00 | 450.00 |
| සිමෙන්ති කොට්ට 01<br>කිලෝ 01 | 970.00<br>30.00 | 950.00<br>25.00 | 950.00<br>25.00 |
| නෝ ලීක් පටි අඩි 01 | 50.00 | 65.00 | 60.00 |
| ෆොලෝ පේන්ට් ලීටර 4 | 4200.00 | 3900.00 | 900.00 |
| දැව ආරක්ෂක ලීටර 4 | 920.00 | 990.00 | 800.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලැබී තිබූ මිල ගණන් අනුව අවම මිල දැක්වීම, ප්‍රවාහන පහසුව හා අවස්ථානුකූල බව ආදිය සළකා බලා ඇස්බැස්ටස් ශීට්, සිමෙන්ති, ෆොලෝ පේන්ට්, දැව ආරක්ෂක මිළදී ගැනීම සඳහා හොඳම මිළ ගණන් ඉදිරිපත් කල දයානි ට්‍රේඩ් සෙන්ටර් - මාපලගම වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ඇස්බැස්ටස් ශීට්, සිමෙන්ති, ෆොලෝ පේන්ට්, දැව ආරක්ෂක මිළදී ගැනීම සුදුසු බවත්, නෝ ලීක් පටි මිළදී ගැනීම සඳහා හොඳම මිළ ඉදිරිපත් කල නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ වෙතින් නෝ ලීක් පටි මිළදී ගැනීම සුදුසු බවත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. ඒ අනුව නාගොඩ ප්‍රාදේශීය සභාවේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඇස්බැස්ටස් ශීට්, සිමෙන්ති, ෆොලෝ පේන්ට්, දැව ආරක්ෂක දයානි ට්‍රේඩ් සෙන්ටර් - මාපලගම වෙතින් මිළදී ගැනීම සහ නෝ ලීක් පටි මිළදී ගැනීම සඳහා හොඳම මිළ ඉදිරිපත් කල නානායක්කාර හාඩ්වෙයාර් - නාගොඩ වෙතින් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

01. 2020.12.21 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සළකා බැලීම සඳහා ඉදිරිපත් කිරීම

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2020 දෙසැම්බර් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව 2021 ජනවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 දෙසැම්බර් මාසයට අදාළ මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය 2021 ජනවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2020 දෙසැම්බර් මාසයට අදාළ මාසික ඒකාබද්ධ වැය සාරාංශය 2021 ජනවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

(ඌ) වෙනත් කරුණු :-

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

සභාපතිතුමාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මුලින්ම හඟරංවල පෙරපාසල ගැන සභාවෙ අවධානය යොමු කරන්න ඕන. හඟරංවල පෙරපාසලේ හිටියෙ තාවකාලික පදනම මත බඳවාගත් පෙරපාසල් පාලිකාවක්. සභාවෙන් එතුමිය ඇතුලු තිදෙනෙකුට වසර ගණනාවක සිට රුපියල් 9000 ක් බැගින් වූ දීමනාවක් ගෙවුවා. ඊට පස්සෙ පහුගිය දවසක එතුමිය ස්ථිර වීම සිදු නොවන නිසා. එතුමිය වෙනත් ආයතනයක රැකියාවට ගිහිල්ලා. ඒ නිසා සභාවෙ හඟරංවල පෙරපාසලේ පාලිකා තනතුර පුරප්පාඩු වුනා. දැන් ඔබතුමා මැදිහත්වෙලා අපට පාලිකාවක් ලබා දීලා තියෙනවා. නමුත් ගරු සභාපතිතුමනි, ඊයෙ රාත්‍රියේ මට දුරකතන ඇමතුම් කිහිපයක් ආවා. ඒක තමයි දැන් ඔබතුමා ලබා දීපු ගුරුතුමියට දීමනාව ගෙවන්නෙ නැහැ කියලා. එතකොට ඒ මුදල දෙමව්පියන්ගෙන් එකතු කරන්න කියල තියෙනවා. එහි විශාල ගැටලුවක් තියෙනවා. මේ දුප්පත් ළමයි ඉන්නෙ. ඒ මුදල එකතු කරගන්න දෙමව්පියන්ට හැකියාවක් නැහැ. කලින් හිටපු පාලිකාව රුපියල් 1000 ක මුදලක් එකතු කරල තියෙනවා. රුපියල් 300 ක මුදලක් පාලිකාවටත්, මාසිකව පත්තරවලට සහ කොන්සට් එකට වශයෙන්. වර්ෂ අවසානයේ කරන කොන්සට් එකට කිසිදු මුදලක් එකතු කරල නැහැ. ඒකත් එක්ක තමයි කලින් මසකට දෙමව්පියෙක්ගෙන් රුපියල් 1000 මුදල එකතු කරල තියෙන්නෙ. නමුත් මෙන්න මෙහෙම ප්‍රායෝගික ගැටලුවක් තියෙනවා ගරු සභාපතිතුමනි. එතකොට යම්කිසි විදිහකින් රුපියල් 500 ක් හෝ 1000 කට ආසන්න ප්‍රමාණයක් එකතු කරනවනම්, ළමයි හතක් විතර තමයි පෙරපාසලේ දැනට ඉතුරු වෙලා තියෙන්නෙ. එතකොට අර සභාවෙන් කලින් දීපු රුපියල් 9000 ක දීමනාව නොදෙන කොට, ඒ පෙරපාසල් පාලිකාවට නොමිලේ උගන්වන්න කියන එක කියන්න බැහැ. නමුත් ජනතාව විදිහට ඉල්ලන ඉල්ලීම සහ නගන චෝදනාව වන්නේ පෙරපාසලට කලින් දීපු රුපියල් 9000 ක මුදල ඇයි ඒ ගුරුතුමියට දෙන්නෙ නැත්තෙ කියලා. ඇයි මේක ළමයින්ගෙ පිටට පවරල තියෙන්නෙ. මේක ළමයින්ට කරන අසාධාරණයක්. මොකද එතන අල්ලපු වැටේ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවෙන් පාලනය වන නාකියදෙනිය පෙරපාසලේ රුපියල් 100 ක් පමණයි ළමයින්ගෙන් එකතු කරන්නෙ. එතකොට ජනතාව හිතනවා ඇයි ප්‍රාදේශීය සභාව මගින් කිසිම දෙයක් කරන්නෙ නැතුව, මුදලුත් එකතු කරලා, පවත්වනු ලබන  පෙර පාසල්වලට මොකටද අපි ළමයි  යවන්නෙ කියලා.  සාමාන්‍යයෙන් පුද්ගලික පෙරපාසලකත් රුපියල් 1000 කට ආසන්න ප්‍රමාණයක් තමයි පෙරපාසලේ ළමයින්ගෙන් එකතු කරන්නෙ. අලුත්වත්තෙත් එහෙම පුද්ගලික පෙර පාසලක් තියෙනවා. එතකොට ඇයි අපි සභාවෙ පෙරපාසලට ළමයි යොමු කරන්නෙ කියන ප්‍රායෝගික ගැටලුව තියෙනවා. මට මේක සඳහා ස්ථිර විසඳුමක් අවශ්‍යයි. මම අහන්නෙ ඇයි කලින් වෙන්කරල සභාවෙන් දීපු රුපියල් 9000 මුදල ගුරුතුමියට  ලබා දීලා, දෙමව්පියන්ට ඒ බර නොදී මේ කටයුත්ත කරගෙන යන්න බැරි ඇයි කියන එක මම අහන්න කැමතියි.

ඒ වගේම ගරු සභාපතිතුමනි, නොම්මර හතර ප්‍රදේශයේ බෝගහ හන්දිය අසල ක්‍රීඩා කරන ස්ථානයක් තියෙනවා. මම වටවල වතු සමාගමත් එක්ක කතා කළාම, එම ස්ථානයෙන් භූමිය ලබා දෙන්න එකගතාවය පළ කළා. සභාවෙ මැදිහත් වීමෙන් හගරංවල බෝගහ හන්දිය අසල ඒ ක්‍රීඩා පිටිය සභාවට ලබා ගන්න කියලා මම යෝජනා කරනවා. මුදල් ප්‍රතිපාදන මම හොයා ගන්නම්. ඒ භූමිය සභාවට ලබා ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මගේ කොට්ඨාසෙ එක දවසයි තවම ලයිට් ටික හදන්න ආවෙ. එතකොට මගේ කොට්ඨාසෙ එක දවසයි තවම පාරවල් ටික සුද්ද කරන්න ආවෙ. දැන් මාස දෙකකට ආසන්න කාලයක් තිස්සෙ මම ඉල්ලීම් කරනවා. ඒ පිළිබඳවත් මේ අවස්ථාවෙදි මතක් කරනවා.

විශේෂයෙන්ම මට මේ පෙරපාසලේ ප්‍රශ්නය ඉතා ඉක්මනින් විසඳලා දීඝ සම්බන්ධයෙන් සභාපතිතුමාගේ සහ සභාවේ අවදානය යොමු කරනවා. නැත්නම් පෙර පාසල වහන්න වේවි. පහුගිය දවස්වල වටවල වතු සමාගම විසින් මේ පෙර පාසල අංග සම්පූර්ණ විදිහට නවීකරණය කරල දුන්නා. එතකොට මේ විදිහට සභාවේ දායකත්වයක් නැතුව තියෙද්දිත් මේ විදිහට මේ ළමයින්ට බර පැටවීම ඉතාමත්ම අසාධාරණ ක්‍රියාවක් කියන එක මතක් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**

හඟරංවල පෙර පාසලේ සේවය කල පාලිකාව වෙනත් පෙරපාසලකට ගියා. එම පුරප්පාඩුව සඳහා ඒ අවට අපේ පෙරපාසල් පාලිකාතුමියක් යොමු කරන්න උත්සාහ ගත්තත්, එසේ කිරීම අසීරු නිසා ලැබී ඇති නව අයදුම්පත්‍රවලට අනුව පුහුණුව ලද පෙර පාසල් පාලිකාවක් ප්‍රායෝගික පුහුණුව සඳහා ඇයගේ කැමැත්ත මත දීමනාවක් රහිතව හඟරංවල පෙර පාසලේ සේවය කරන්න කැමත්ත ප්‍රකාශ කළා. ඒ වගේම අපේ කාඩර් එකේ අනුමත වෙලා තියෙන්නෙ පෙර පාසල් පාලිකා තනතුරු 03 යි. නමුත් දැනටත් ස්ථිර පෙර පාසල් පාලිකාවන් 10 දෙනෙක් ඉන්නවා.ඒ නිසා තනතුරේ ස්ථිර කල නොහැකි බවත් ඇයට පැහැදිලි කළා.

ඒ වගේම ඔබතුමා කියන දීමනාව අපිට ලබා දිය නොහැකි බවත්, නව පෙරපාසල් පාලිකාතුමියට පැහැදිලි කල අතර, එතුමියට එම මුදල ලබා දුන හොත්, සහා පෙර පාසල් තුල පුහුණුව ලබන අනෙකුත් අය සඳහාත් ගෙවීමට සිදු වන බැවින් අපට එම මුදල ගෙවීමට අපහසු වන අතර එසේ මුදලක් ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන් කර නැහැ. දැනට කටයුතු කරගෙන යන්න සිදු වන්නෙ මේ ආකාරයට. ඉදිරියෙදි මේ සම්බන්ධව සාකච්ඡා කර කටයුතු කරමු.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

මම සභාවට යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. ඒකෙන් අර පළවෙනි යෝජනාව, අක්කර අසූවෙ ප්‍රජා ශාලාව පිළිබඳ පසුගිය සභා වාරෙත් මෙතන කතා බහ වුනා. ඒකෙ ගැටලුවක් පිළිබඳ මම සාකච්ඡා කළා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටියා. මේක මම ප්‍රාදේශීය සංවර්ධන කමිටුවෙත්, ලේකම්තුමිය ඉස්සරහත් කතා කළා. නමුත් ප්‍රශ්නෙ විසඳුනේ නැහැ. එවලෙ ඒ ප්‍රශ්නෙ විසඳන්න ඔබතුමාට හැකියාව තිබුනා. නමුත් ඒ ප්‍රශ්නෙ ස්වභාවය වෙනස් වෙලා තියෙනවා. පළවෙනි කාරණය තමයි ඒ ප්‍රාදේශීය ලේකම්තුමිය කියන්නෙ, ප්‍රජා ශාලාවට ඒ නිලධාරි යොමු කරන්න නම් සභාවෙන් ලේකම්තුමියට නීත්‍යානුකූලව පවරල දෙන්න ඕනැයි කියන කාරණය. එතකොට අපි සභාවක් හැටියට අපේ සම්පතක් එහෙම දෙන්න අපි අකමැතියි. ඉතිං ඒක නිසා පසුගිය සභා වාරෙ ඒක ප්‍රකාශ කළා. ඒ නිසා ඒ කටයුත්ත සිදු වුනේ නැහැ. ඒ එක්කම එතන ඒ ප්‍රජා ශාලාව එහෙමනම් දැන් මිනිස්සු කියන්නෙ, මේක කොහොම හරි ප්‍රාදේශීය ලේකම්ට පවරල දීල හරි, ඒ නිලධාරි එතනට යොමු කරන්න. මගේ අදහස එහෙම කළත් නැතත්, ප්‍රජා ශාලාව නඩත්තු කිරීමේ අවශ්‍යාවයක් තියෙනවා. එහි විදුලි බලය නැහැ. ඊලඟට ඒකෙ අනවශ්‍ය භාවිතයන් තියෙනවා. මෙය සභාවෙ සම්පතක් නම් ඒක නඩත්තු කිරීමේ වගකීමක් තියෙනවා. ඒ නිසා මම මේ වෙලාවෙ ඉල්ලා සිටිනවා. දැන් අක්කර අසූව ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම තිබුනෙ ඒ ප්‍රජාශාලාව රජයේ නිලධාරීන්ගෙ කාර්යාලය හැටියට පවත්වගෙන යන්න අවස්ථාව සලසල දෙන්න කියලා. එතකොට දැන් අර කලින් පාරක ගැටලුව වගේ, ඒකෙ දෙපැත්තක් ආවා. ඊට පස්සෙ එතනට ගෙනියනවට, ඊට මෙහා ප්‍රදේශයේ මිනිස්සු අකමැති තත්වයක් තියෙනවා. ඒ අය එහෙම ලිඛිතව දැනුම් දීල තියෙනවා. ඒක නිසා මම ඒකෙ ඉල්ලීම කරන්නෙ දැනට ඒ පැවරීම සහ ඒ රජයේ නිලධාරීන් යොමු කිරීම කෙසේ වෙතත්, ඒක නඩත්තු කිරීමේ අවශ්‍යතාවය තියෙනවා. ඒක සොයල බලල අපේ කාර්මික නිලධාරියෙක් යොමු කරලා, ඒක නඩත්තු කරන්න. අපරාදෙ සම්පතක් නිකන් කැලේ වැවිලා, තේරුමක් නැතුව අපතේ යන තත්වයට පත්වෙලා තියෙනවා.

ඊලගට ගරු සභාපතිතුමනි, මම මේ කාරණයත් මේ සභාවෙම කතා කළා. මම දන්නෙ නැහැ මේකට මොකක්ද ගන්න පුලුවන් පියවර කියලා. වසර හයක් තිස්සේ දිගින් දිගටම ඇදෙමින් යන පාලම් ව්‍යාපෘතිය ඒ ප්‍රදේශයේම ගැටලුවක්. දැන් අවුරුදු හයක් වෙනවා. විශේෂයෙන් මේ වෙලාවෙ සිහිපත් කරන්න ඕන. පසුගිය රජයෙන් ආරම්භ කරපු පාලම් සමහර විට අපි දන්නෙත් නැහැ කොහෙන් සල්ලි යනවද මොනවද කියලා. මේ වෙන කොට හදලා සම්පූර්ණ කරල ඉවරයි. ඒ පාලම් සකස්කිරීම සහ මේ පාලම පිළිබඳ සංසංදනයක් තමයි මිනිස්සු කරන්නෙ. අපිට තමයි මේ නිසා ඉන්න අපහසුවෙලා තියෙන්නෙ. ඒක දිස්ත්‍රික් සංවර්ධන කමිටුවෙත් කතා කරලා, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවෙත් කතා කරලා, නිලධාරි එකතුවෙලා, අවසානෙ වුනේ අපේ බල කිරීම මත ආර් ඩී ඒ එකෙන් ඍජු ශ්‍රමයෙන් ඒකෙ ස්ලැබ් එක දාන්න අවශ්‍ය එව් අයන් තියලා ඒක සකස් කරල තියෙන්නෙ. දැන් ඒකෙ අවසාන අධියර ඉතුරු වෙලා තියෙන්නෙ. උඩ ස්ලැබ් එක වගේ කොන්ක්‍රීට් එක දාන්න විතරයි තියෙන්නෙ. ඊට පස්සෙ මේක ඉවර කරලා දැන් මාසයක් වෙනවා. මේක ඒ ඉංජිනේරුතුමිය කොන්ත්‍රාත් කරුට දැනුම් දුන්නා. එයා පළවෙනි දවසෙ කිව්වා මම දවස් දෙකකින් ඇවිල්ලා ඉතිරි වැඩ ටික කරන්නම් කියලා. හැබැයි දැන් මාසෙකටත් වැඩියි. එයාල ගිහිල්ලා අවසානෙ කොන්ත්‍රාත් කරුවා කතා කරන්නෙත් නැහැ. ටෙලිෆෝන් එක උස්සන්නෙත් නැහැ. ඊට පස්සෙ ඉංජිනේරුතුමිය ගත්තත්, ෆෝන් එක උස්සන් නැහැ. මේ මනුස්සය ආවෙ නැහැ. මේක දිගින් දිගටම අතපසු කරනවා. ඊට පස්සෙ පසුගිය සිකුරාදා මේ පිළිබඳ විශේෂ සාකච්ඡාවක් තිබුනා. ඒ ප්‍රධාන ඉංජිනේරුතුමත් සමග දැන් ආපහු ඒ මනුස්සය මාසෙකට කල් ඉල්ලලා. ඉතිං මට මේක හරි ගැටලුවක්. ඉතිං මේ මනුස්සය මේක කරන්නෙත් නැහැ. එතකොට මොකක්ද මේ නීතිය. අවුරුදු හයක් තිස්සෙ එයාට දීපු ටෙන්ඩර් පටිපාටියක් මත දීපු කොන්ත්‍රාත්තුව දිගින් දිගටම මෙහෙම ප්‍රමාද වෙලා, මේවට ප්‍රමාද ගාස්තු අය කරගෙනද? එහෙම නැත්නම් මේවයි මොකක්ද මේ තියෙන ගැටලුව? තවත් මාසයක් කල් දීලා කොහොමද කරන්නෙ පුදුම ගැටලුවක් මේක. ජනමාධ්‍යත් එක්ක ගිහින් සියළු තොරතුරු ලබා දි අවශ්‍ය කටයුතු කළා. හරිනම් රජයට කොන්ත්‍රාත්තරුගෙන් මුදලක් අය වෙන්න ඕන. සභාවෙ අපේ තාක්ෂණ නිලධාරීතුමිය ගිහිල්ලා වාර්තාවකුත් අරන් යැව්වා. අවසාන කොටස විතරයි ඉතුරු වෙලා තියෙන්නෙ. ඒකටත් තව කල් ඉල්ලනවා. මෙයා මේ කිව්වට තව මාසෙකින් මේක කරන්නෙ නැහැ. අපිට වෙන්නෙ ඉතිං මිනිස්සුන්ට මුහුන දෙන්න බැරුව යනවා. ඊළඟට යකඩ දිරනවා. ඒක නිසා මේකට සභාව හැටියට ඔබතුමා මැදිහත් වෙලා, මොකක් හරි දැඩි පියවරක් ගන්න. අපි බලාපොරොත්තු වෙනවා ඒක ඉක්මනින් නිම කර ගන්න

ඊලග කාරණය, ගරු සභාපතිතුමනි, අද සඳහන් කළ පරිදි මගේ කොට්ඨාසයේ පාරවල් ගණනාවක් දැන් මේ වන විට අපේ තාක්ෂණ නිලධාරී මහත්තය ගිහිල්ල ඇස්තමේන්තුත් සකස් කරල තියෙන්නෙ. අවශ්‍යම පාරවල් කීපයක්, ඒ නිසා මම ඉල්ලීම කරනවා. මගේ කොට්ඨාසයට වසම් 04 යි තියෙන්නෙ. ඒ වසම් හතරට අඩුම ගානෙ, එක වසමකට රුපියල් 50000 බැගින් වෙන්නවත් දැනට ඇස්තමේන්තු සකස් කරපු මාර්ග ටික සකස් කර ගන්න මට අවස්ථාව සලසල දෙන්න කියන ඉල්ලීම කරනවා. ඊලගට තව මාර්ගයක් පිළිබඳව සඳහන් කළා. උඩුගම මධ්‍යම ග්‍රාම නිලධාරී වසමේ සිරිසීලවංශ මාවතේ පළමු පටුමහ මාර්ගය පිළිබඳව මිනිස්සුන්ට ගැටලුවක් තියෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා අපේ තාක්ෂණ නිලධාරී මහත්තයෙක් යොමු කරලා, ඒ මාර්ගය නිරවුල් කරලා, පොඩ්ඩක් සුද්ද පවිත්‍ර කරල දෙන්න. ඒක විශේෂයෙන් සිහිපත් කරනවා. යෝජනාවක් හැටියටත් ඉදිරිපත් කරල තියෙනවා.

ඊලගට අනික් කාරණය, වීථි පහන් පිළිබඳව. මේ සම්බන්ධවත් මම මීට පෙර සභාවට අවශ්‍යම ස්ථාන කීපයක් ඉදිරපත් කලා. අපේ තාක්ෂණ නිලධාරීතුමිය ගිහිල්ලා, ඒ අවශ්‍ය තැන් නිර්දේශ කරලත් තියෙනවා. එයින් ගොඩක් සුදුසු තැන් හැටියට නිර්දේශ වුනු බව මගේ අදහස. ඒ නිසා ඒ වීථි පහන් කීපය ඉක්මනින් සවි කරල දෙන්න කියන ඉල්ලීම කරනවා. ඒ වගේම මම කලින් කියපු

විදිහට ඒ යෝජනා ටිකේ දැනට සකස් කරපු ඇස්තමේන්තුවල වැඩකටයුතු ටික කරගන්න අවස්ථාව සලසල දෙන්න කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**

මම දැන් ග්‍රාමීය පාලම් සම්බන්ධව කටයුතු කරන ඉංජිනේරුතුමියට කතා කළා. ඔබතුමා ප්‍රකාශ කලා වගේ, එතුමිය කිව්වෙ, මාසයක් කල් ඉල්ලපු බව තමයි. මේ සම්බන්ධව දැන් හැමතැනම කතා කරලා, මන්ත්‍රීවරුත් එතුමියට කතා කලයි කිව්වා. එතුමිය කියනවා හෙටද කොහෙද පටන් ගන්නවයි කියලා. එහෙම නැත්තම් කොන්ත්‍රාත්කරු ඉවත් කරන බවත්, ඔහුගේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා අවසන් ලියුමත් සකස් කර ඇති බවත් එතුමිය ප්‍රකාශ කළා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, 2021 පළවෙනි සභා රැස්වීම අද පැවැත්වෙන්නෙ. ඒ නිසා සියලුම දෙනාට සුභ නව වසරක් කියල ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, 28 වෙනිද පෝය දවසෙ අපේ ග්‍රාමීය කමිටු හතරම එකතු කරගෙන, උඩවැලිවිටිය තලාව ප්‍රධාන මාර්ගය සුද්ද පවිත්‍ර කිරීම සඳහා අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ගරු සභාපතිතුමාගේ පූර්ණ අනුග්‍රහයත් ඔබතුමාගේ සහයෝගයත් පළමුවෙන් මම මේ වෙලාවෙ ඉල්ලා සිටිනවා. ඒ වගේම ඒ සඳහා ඒ අවශ්‍ය උපකරණ ටිකත් ලබා දෙන්න කියන ඉල්ලීමත් කරනවා. ඒ වගේම ඔබතුමා කොට්ඨාස 15 ටම ප්‍රදේශය සංවර්ධනය කරන්න. සභාවෙ තියෙන මුදල් ප්‍රතිපාදන මත මුදලක් බලා දීමට යෝජනා කිරීම පිළිබඳව අපේ ගෞරවය මේ වෙලාවෙ ඔබතුමාට ප්‍රධානය කරනවා.ඒ වගේම මම උඩවැලිවිටිය කොට්ඨාසයටත් ඒ මුදල් ප්‍රමාණයකින් වීජී පහන් 20 ක් විතර ලබා දෙන්න කියන ඉල්ලීමක් කරනවා. යෝජනාව මට ලිඛිතව දාන්න බැරි වුනත් මේ වෙලාවෙ මම ඒ යෝජනාව කරනවා.

ඒ වගේම ලිඛිතව දාන්න බැරිවුනත් ගල්ලෙනමුල්ල කොණ්ඩුගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහාත්, ඒ අවශ්‍ය ප්‍රතිපාදන ඒ අනුව ලබා දෙන්න කියන ඉල්ලීමත් මේ වෙලාවෙ සිදු කරනවා. ඒ වගේම අපි 2021 වර්ෂයේ සංවර්ධන යෝජනා විශාල ප්‍රමාණයක් ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ පෙළගස්වලා, කරන්න සූදානම් වෙලා ඉන්න වෙලාවෙ ප්‍රාදේශීය සභාවෙනුත් ඒ සඳහා පෙළගැස්මක් සිදු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපේ පූර්ණ සහයෝගය ලබා දෙන බවත් සඳහන් කරමින්, විශේෂයෙන් අපේ උඩවැලිවිටියතලාව මහා විද්‍යාලයේ ඊයෙ දවසේ කොරෝනා ආශ්‍රිතයෙකු නිසා. ඒ ළමයි කීප දෙනෙකු නිරෝධායනයට ලක් කරල තියෙනවා. ඒ අනුව ඒ උඩවැලිවිටිය තලාව මහා විද්‍යාලය ගරු සභාපතිතුමා මේ වනවිටත් විෂබීජහරනය කරල දෙන්න කටයුතු කරල තියෙනවා. ඒ පිළිබඳවත් ඔබතුමාට ස්තූති වන්ත වෙමින්, සුබ අනාගතයක් සැමට පතමින් නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමන් ඇතුලු සමස්ථ සභාවෙන් අවසරයි. 2021 වසර සියලු දෙනාටම නිරෝගීව ජීවත් වීමට කාලය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කල සුසාන භූමියක් පිළිබඳ යෝජනාව අප ගමට අවශ්‍යම දෙයක්. අපේ ගම්වල, එක ඉඩමෙ ගෙවල් පහක් වගේ හදාගෙන මිනිස්සු ජීවත් වෙන්නෙ. ඒ මිනිස්සුන්ට ඒ ආදාහන කටයුතු කර ගැනීමට බිම් කොටසක් නැහැ. එම නිසා අපට වෙන්වුන ඉඩම් කැබැල්ලක් නොම්මර 20 ප්‍රදේශයේ තියෙනවා. ඒක සභාවට අරගෙන එය අපට සුසාන භූමි සඳහා ස්ථාපිත කරල දෙන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම ඉදිරිපත් කල ඌරල පහල පාර සම්බන්ධ ප්‍රශ්නය, ඒක ඇත්තටම ඒ ගම්වාසීන්ගෙන් ලැබුන ප්‍රශ්නයක්. මම හිතන්නෙ දැන් ප්‍රශ්නයක් නොවෙන්න පුලුවන්.

නමුත් ඒ අපේ හාල් ටිකෙන් සීනි ටිකෙන් සබන් කැල්ලෙන් ගන්න මුදලින් තමයි ඒ පාරවල් හැදුනෙ. ඒ පාරවල් වහන්න අපට කිසිමසේත් අයිතියක් නැහැ. තනි ගෙදරකට යන්න එහෙම පාරක් වහනවනම්, කොහොමද අපි මේ රජයක් ආණ්ඩුවක් ගෙනියන්නෙ කියලා ඔබතුමා දන්නවා. එම නිසා ගරු සභාපතිතුමනි, එයට වහාම පියවරක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මේ කොරෝනා සම්බන්ධව පවුල් නිරෝධායනය කරනවා. ඒ නිරෝධායනය කරන කොට දවස් 14 ක් ඒ මිනිස්සු ගෙදරට වෙලා ඉන්න ඕන. එහෙම ඉන්න අවස්ථාවෙ අපේම සහෝදරයෙක් වන මේ සභාවෙ රංජි මහත්මයට කිසිම දෙයක් ලැබිල නැහැ. ඇත්තටම අපිට ඒක කණගාටුයි. කොරෝනා සම්බන්ධ නිරෝධායනය කොලෙත් ගෙදර අලවලා තියෙනවා. කිසිම දෙයක් බඩු මල්ලක්වත් මොනවක්වත් ලැබිල නැහැ. නිරෝධායනය වෙලා ගෙදර හිටියා. එතන ගෙවල් දෙකකට හම්බවෙලා නැහැ. ගරු සභාපතිතුමනි, ඒ ගැන සොයා බලන්න ඕන. අපේ සහෝදරයෙක් වගේ අපේ පවුලෙ ඥාතියෙක් වගේ අපි එකට වැඩ කරන්නෙ. ඒ නිරෝධායන බෝඩ් එක ඇලෙව්වයින් පස්සෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනිවාර්යයෙන් බඩු මල්ලක් දෙන්න ඕන. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ඒ මහත්මය අල්ලපු කඬේට කොල් එකක් දීල තමයි බඩු ටික ගෙන්න ගෙන තිබුනෙ. අපි මන්ත්‍රීවරු හැටියට අපිත් වැරදියි. එහෙම දෙයක් ඇසීම පිළිබඳව ඇත්තටම අපිටත් කණගාටුයි. ගරු සභාපතිතුමනි, එහෙම සිදු වෙන්න දෙන්න එපා කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, අපේ අතිගරු ජනාධිපතිතුමාගෙ සංකල්පයක් මත අපි 215 බී අලුත් පහල බටහිර ග්‍රාම නිලධාරී වසමෙ පුරන් කුඹුරු අක්කර 47 ක් අස්වැද්දුවා. දැන් එයට ඉතාමත් දරුණු රෝගයක් බෝවෙලා තියෙනවා. ඒ යායම විනාසයට පත්වෙලා තියෙනවා. ඒ ගැන කෘෂි කර්ම දෙපාර්තමේන්තුවෙන්වත්, ගොවිජන මධ්‍යස්ථානයෙන්වත් කිසිම බලධාරියෙක් මෙතෙක් ගිහින්සොයා බලලා නැහැ. අපි කතා කළා. කිසිම පිහිටක් නැහැ. ගරු සභාපතිතුමනි, ඒ මිනිස්සු කනකර බඩු උගස්තියලා, බොහොම අමාරුවෙන් රු. 1500 බැගින් අත්තම් දීලා, තමයි ඔය ගොවිතැන් කළේ. මෙයට කිසිම පියවරක් අරගෙන නැහැ. ගරු සභාපතිතුමනි, ඒ වගේ තමයි පරිසරය පැත්තෙන් ගත්තම, කුඹුරු ගොඩ කිරීම් ඉතාම සීඝයෙන් කරගෙන යනවා. සියල්ල පුරන් කුඹුරු කියලා, මේ හොඳ ගොවිතැන් ගොඩ කරගෙන යනවා. මට කියන්න පුලුවන් ඌරල සිට බෝවිටියමුල්ල, මලාමුර, තල්ගස්වල, අපේ ගොවිජන මධ්‍යස්ථානය දක්වා සියලුම ගොවිතැන්වල භාගයක් ගොඩකරගෙන ගිහිල්ලා. ඒ විතරක් නෙවෙයි ගෙවල් හදලා, විදුලියත් අරගෙන. ගරු සභාපතිතුමනි, මෙයට අපේ අවධානය යොමු වෙලා නැහැ.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, පස් කැපීම ඉතාම සීග්‍රයෙන් වැඩිවෙලා තියෙනවා. යම් ක්‍රමවේදෙකට පස් කපන්න පුලුවන්. නමුත් පාරෙ ගෙනියන හැටි බලන්න. ටෙන්ට් එකක් දාගෙන හෝ කිසිම ආවරනයක් නැතිව පස් ප්‍රවාහනය කරනවා. මාපලගම ටවුන් එකට එහා නිවසක පාර හරහා පස් ඇද්දා. නමුත් එතන බයිසිකල් ලිස්සලා, තුන් හතර දෙනෙක් වැටිලා ඉස්පිරිතාලෙත් රැගෙන ගිහින් තියෙනවා. ඒ කියන්නෙ පාරෙ තමයි පස් ටික හලාගෙන යන්නෙ. ඒව පේන්නෙ නැහැ. ඒ වගේම තමයි අපට රණවිරු ගම්මානයේ ඉඩම් කැබැල්ලක් ආදාහනාගාරයක් සඳහා වෙන්වෙලා තිබුනා. ඒ ඉඩම් කැබැල්ලෙ පස් කපලා, ඒ ඉඩම සම්පූර්ණයෙන්ම විනාශ වුනා. එයට කිසිම බලධාරියෙක් තීරණයක් ගත්තෙ නැහැ. මොකක්ද මේ වෙන්නෙ කියන එකවත් බැලුවෙ නැහැ. අන්න ඒ වගේ ගරු සභාපතිතුමනි, පරිසරය විනාශයට පත්වෙලා තියෙන්නෙ. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, බිම් මට්ටමේ සිට ඉහල දක්වා මේ පරිසරය විනාශයට පත්වෙනවා. ඒ වගේම තමයි අපේ රටේ සම්පත් පිළිබඳව කතා කළත් එහෙමයි. කොළඹ ජැටිය දැන් අදානි සමාගමට දීලා. ඒ වගේ අපේ සම්පත් විනාශ වෙමින් පවතිනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි, නිරෝධායනය වෙන ගෙවල්වලට ඔබතුමන්ගේ බලතල පාවිච්චි කර, ඒ කටයුතු කරන මෙන් ඉල්ලමින්, සියලු මන්ත්‍රීතුමන්ලට, මන්ත්‍රීතුමියන්ලට, ලේකම්තුමිය ඇතුළු සියලුම දෙනාට මේ ලැබුවා වූ නව වසර සුබම සුබ නව වසරක් වෙන්න ප්‍රාර්ථනා කරමින්, නීති ගරුක, විනය ගරුක සමාජයක් බිහිකිරීමට ධෛර්යය ශක්තියක් ලැබේවා. නීතිය හැමෝටම එකහා සමානව භුක්ති විඳිමින් කල් ගෙවීමට වාසනාව උදාවේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**

ගරු මන්ත්‍රීතුමා රුපියල් 10000 ක බඩු මල්ල සෑම නිරෝධායනය වෙච්ච නිවසකටම දෙන්න ඕන. වරදවා හිතන්න එපා නිරෝධායන ක්‍රමවේද කීපයක් තියෙනවා. පී.එච්.අයි. නිලධාරීන් කරන නිරෝධායනයන්වලට රුපියල් 10000 ක බඩු මල්ල ලැබෙනවා. නමුත් අර සාමාන්‍ය විදිහට දෙවෙනි පෙළ ආශ්‍රිතයන්ට ඉන්න කියනවා. බෝඩ් එක ගහන්නෙ නැහැ අන්න ඒ අයට බඩු මල්ල දෙන්නෙ නැහැ. ඔබතුමා ප්‍රකාශ කල කරුණ පිළිබඳව මම සොයා බලන්නම්.

අනවසර ගොඩ කිරීම් පිළිබඳව කතා කළොත්, ඉදිරියෙදි නම් එක බිම් අඟලකවත් කුඹුරු ගොඩ කරන්න දෙන්නෙ නැති බව වර්ථමාන කෘෂිකර්ම අමාත්‍යතුමා අපි ඉදිරියෙම ප්‍රකාශ කළා. ඒ වගේම මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කිරීමේදී අපට, මේ ප්‍රදේශයට, අදාල කරුණු පමණක් කතා කළොත් හොඳයි කියලා මම හිතනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමා ඇතුලු සියලුම දෙනාගෙන් අවසරයි. මුලින්ම 2021 නව වසර සියලු දෙනාට සුබ නව වසරක් වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අපිත් එක්ක ප්‍රාදේශීය සභාවෙ හැමදාම වාඩිවෙලා ඉන්න වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමන්ගේ පවුලේ අයත්,ඇතුළුව සියලුම රෝගීන්ට ඉක්මන් සුවය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, ඒ වගේම නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා මෙම ප්‍රදේශයෙන් බැහැරව ඉන්න නිසා අද දින සභාවට සහභාගි වෙන්න නොහැකි බවත් දැනුම් දෙන්න කිව්වා. ඔහුගේ නිවාඩුව අනුමත කර දෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවෙ කතා කළ යුතුම දෙයක් තියෙනවා. මේ අහඹු ලෙස කරන පීසීආර් පරීක්ෂණවල ප්‍රතිඵලය ඉතාමත් භයානකයි. සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාව විදිහට අපිට ඒ අදාල අංශ දැනුවත් කරන්න පුලුවන්නම් මෙන්න මේ ආකාරයට මම පොඩි උදාහරණයක් කියන්නම් ගරු සභාපතිතුමනි, සමහර වෙලාවට එක එක ස්ථානවල පොළවල් ආශ්‍රිතව අහඹු ලෙස පීසීආර් පරීක්ෂණ සිදු කරනවා. ඒ පීසීආර් පරීක්ෂණයට ඔවුන් මුහුන දෙන්න බලාගෙන නෙවෙයි ඒ ස්ථානයට එන්නෙ. මොකද අහඹු ලෙස කරන පීසීආර් පරීක්ෂණය කරලා ඒ මිනිස්සු වෙළෙන්දො වෙන්න පුලුවන් ආයෙමත් ගිහිල්ලා, ඔවුන් එදිනෙදා කාර්යයන් කරනවා. නමුත් දවසකින් දෙකකින් රිපෝට් එක එනවා මෙයා පොසිටිව් කියලා. ඒ වගේ දේවල් සිදු වෙලා. දැන් අද වෙන කොට අපේ වනිගරත්න මහත්තයගෙ අක්කර 80 ප්‍රදේශයේ පවුල් 20 ක් නිරෝධායනයට ලක් කරල තියෙනවා. මොකද පීසීආර් පරීක්ෂණයට පොළේදි මුහුන දුන්නා. එයා ඊට පස්සෙ පොළේ බඩු විකුනුවා. ඊලග දවසෙත් පොළේ ගියා. අපේ සභාවට අයිති පොළවල් දෙකේම ගිහිල්ල ඉවරවෙලා, ඊලග දවසෙ උඩුගම නැගෙනහිර ක්‍රීඩාංගනයේ තරුණ පිරිසත් එක්ක ක්‍රීඩා කරලා. ඉතාං ඒ පවුල් 20 ක් අද වෙන කොට සති දෙකක නිරෝධායනයට ලක් කරලා තියෙනවා. ඉතිං මම හිතන්නෙ ඒ ක්‍රමවේදයේ තියෙන විශාල වැරැද්දක්. මොකද අඩුම තරමින් අපි අර පුංචි කාලෙ පනු බෙහෙත් බොනවනම් ඊලග දවසෙ ඇඹුල් කන්නෙ නැහැ. ඒ වගේ අපේ ක්‍රමවේදයක් තියෙනවා. ඔබ මෙතනින් පස්සෙ මහජනයත් එක්ක ගැටෙන්න එපා. ඔබ යම් සැකයක් නිසා තමයි මේ පරීක්ෂණයට මුහුන දුන්නෙ. මේකෙ ප්‍රතිඵල එනතෙක් ඔබ අනිත් අයත් එක්ක ගැටෙන්න එපා කියලා, අර පීසීආර් පරීක්ෂණයට

ලක් කරන පුද්ගලයට නිසි ලෙස, දැඩි ලෙස අවවාද කළ යුතුයි. නමුත් ඒ අය කරන්නෙ මොකක්ද තම තමන්ගෙ එදිනෙදා කටයුතු කරනවා. ඊට පස්සෙ පවුල් 20 ක් 30 ක් නිරෝධායනයට ලක් වෙනවා. ඊට පස්සෙ රු. 10000.00 රජයෙන් ඉල්ලයි. ඒවගේම අරක නැහැ මේක නැහැ කියලා සභාවට චෝදනා එනවා. ඊට පස්සෙ විෂබීජහරණය කරන්න ආවෙ නැහැ කියයි. නමුත් ඇත්තටම අපි මේ ඕනකමින් තමයි මේ තත්වෙට පත්වෙලා තියෙන්නෙ. පහුගිය කාලය දිහා බැලුවම ඒ පොසිටිව් වුන ලෙඩ්ඩු හරහා සහ පීසීආර් පරීක්ෂණවල තියෙන ක්‍රමවේදය සහ දැනුම් දීමේ, අවවාද කිරීමේ දුර්වල කමක් තමයි මම නම් දකින්නෙ. ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ ඒ සඳහා අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සමග කතා කරලා, එහෙම අහඹු ලෙස පීසීආර් පරීක්ෂණ හරි කොයි ආකාරයකින් හරි කරනවනම්, ඔවුන් එතනින් පස්සෙ දවසකින් හරි දෙකකින් හරි ඒ වාර්තාව එනතුරු තමන්ගේ ආරක්ෂා සහිත ස්ථානයක ඔවුන්ට නවතින්න කියන එක කියන්න වෙන්නෙ. ඒක ක්‍රියාත්මක වෙනවනම්, මේ ප්‍රදේශයෙන් භාගයක් අද වෙනකොට නිරෝධායනයට ලක් වෙන්න ඕන නැහැ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ ප්‍රාදේශීය සභාව, තවලම,නෙළුව සහ අවට ප්‍රාදේශීය සභා එක්ක බැලුවම, ඔබතුමා කණගාටුවට ලක් වෙන්න එපා. සභාවෙ මන්ත්‍රීවරු විදිහට උප සභාපතිතුමා, සභාපතිතුමා අපි කවුරුත් මේ සඳහා අපි කරන ක්‍රමවේදය ඉතාමත් අසාර්ථකයි කියල තමයි මේ අවස්ථාවෙ කණගාටුවෙන් වුනත් ප්‍රකාශ කරන්න වෙන්නෙ. හිනිදුම ප්‍රදේශයේ මගේ දෙමව්පියන් ජීවත් වෙන්නෙ. ඒ ප්‍රදේශයට ගියහම පේනවා. ඒ ප්‍රාදේශීය සභාවෙ නිතරම වාහනයක් ගිහිල්ල අදාල සේවකයන් යොදාගෙන විශබීජහරණ කටයුතු කරනවා. ඒක දිනපතා අඛණ්ඩව සමහර වෙලාවට පැය විසිහතර පුරාවටම අපි දකිනවා. නමුත් අපේ ප්‍රාදේශීය සභාවෙ සමහර වෙලාවට අපේ සහබන්දු විපක්ෂ නායකතුමා කියාවි. වනමල් මන්ත්‍රීතුමාගෙ නිවසෙ විෂබීජහරණය කරන්නවත් අපේ සභාවෙ සේවකයෙක් ඉදිරිපත් වෙන්නෙ නැති තත්වයක් තියෙනවා. නමුත් අපට සේවකයන්ට බල කරන්න බැහැ. නමුත් සේවකයො කළා හෝ නොකළා අපි යම් ක්‍රමවේදයක් ඒ සඳහා හදාගන්න ඕන. ඒ සේවකයන්ගෙන් ඒක වෙන්නෙ නැත්නම් අපි සභාවක් විදිහට තීරණයක් ගන්න ඕන. මේ සඳහා භාහිර පුද්ගලයන් හතර පස් දෙනෙක් හරි බඳවා ගෙන, මුදලක් වියදම් කරල හරි, කෙරෙන්න ඕන දේ නියම අවස්ථාවෙ කරන්න. මොකද ඒක වෙන්නෙ නැත්නම් අපි සභාවක් විදිහට මේ රැස්වෙලා, තේ එක බීලා අපි හැමදාම කියනවා වගේ අපේ පඩි පැකට් එක ගන්න විතරයි අපි මේ ස්ථානයට එන්නෙ. ඒක මම හිතන්නෙ ඔබතුමාටත්, උප සභාපතිතුමාටත්, මේ මන්ත්‍රීවරු අනිත් 25 දෙනාටම සහ මේ සභාවෙ නිලධාරී ඇතුලු සියලුම දෙනාට ලැජ්ජාවට කරුණක්. මොකද මුලු රටම මේ වෙලාවෙ සෞඛ්‍ය අංශත් එක්ක එකතුවෙලා, ප්‍රාදේශීය සභා මේ සඳහා දැඩි ලෙස මැදිහත් වෙලා ඉන්න වෙලාවක, අපි වෙන වෙන කටයුතු තමයි දිනපතා කරන්නෙ. නමුත් ඉතිං අපි ඒ මොනව කළත්, මේ අවස්ථාවෙ අංක එකට කෙරෙන්න ඕන දේ අපි මගහැරලයි කියල තමයි කණගාටුවෙන් වුනත් කියන්න වෙන්නෙ. ඒ නිසා මම හිතන්නෙ සභාවක් විදිහට වහාම තීරණයක් අරගෙන, ඒ සඳහා මැදිහත් වෙලා, අඩුම තරමින් විෂබීජහරණය කරන්නවත් වාහනයක් යොදාගෙන, අඛණ්ඩව ඒ සඳහා කණ්ඩායමක් වෙන් කරලා අපි සූදානමක් තියා ගෙන ඉන්න ඕන කියලා, සහ ඒක ක්‍රියාත්මක කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, ඊයෙ දිනයේ උඩුගම පොළ වැහුවා. වෙළෙන්දො දෙන්නෙක්ගෙ කොවිඩ් පොසිටිව් වුන කතාව ආරංචි වුන විගස, මම සභාපතිතුමාට කිව්වා. අවට ප්‍රදේශයේ නෙළුව, තවලම, ඕපාත වගේ ස්ථානවල සියලුම පොළවල් වහලා. ඒ වෙළෙන්දො ටිකම තමයි බොහෝ දුරට උඩුගම පොළටත් එන්නෙ. අපේ පොළ වහන එක අපි කතාබහ කළාට, ඒක අපේ මහජනතාවට දැනුම් දෙන්න ක්‍රමවේදයක්, ක්‍රියාමාර්ගයක් අපි ගත්තෙ නැහැ. මොකද ඒක මුලින්ම කරන්න ඕන. තීරණයක් ගත්තනම්, ගත්ත වහාම අඩුම තරමින් බැනර් එකක්වත් ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කරන්න ඕන. වෙළෙන්දොන්ට කියන එක නෙවෙයි පොළේ සල්ලි එකතු කරන එක්කෙනාට කියනවට වඩා

මහජනතාව දැනුවත් කරන්න ඕන. මොකද පොළ තියෙන දවසට දෙතුන් දාහක් ඔය පොළට එනවා. ඒ මිනිස්සු අපහසුතාවයට පත් නොවෙන්න, ඒ ගැටීම වලක්වන්න සහ ඔවුන්ට ඒ දිනය අතහැරලා ඒකට සුදුසු ආකාරයකින් යන එන පැත්තකින් එලවළු ටිකක් හරි එතකොට අරගෙන එන්න පුළුවන්. ඒ නිසා අපි ඒ තීරණය ගත්තු වහාම ඒක ක්‍රියාත්මක කරද්දි මුලින්ම කරන්න ඕන දේ තමයි ඒ දැනුම් දීම කරන එක. මේ අපි අපි කතා කරනව වගේම ඒක මහජනතාවට දැනුම් දීමට සාධාරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්න ඕන. අපි වගකිවයුතු ආයතනයක් විදිහට අපි ඒක කළේ නැහැ. නමුත් ඉදිරියටත් මේ වගේ පොළවල් වසා දැමීමට කටයුතු කරනවනම්, අපි නැවත දැනුම් දෙන තුරු මේ පොළ වහනවයි කියලා බැනරයක්වත් ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදන්න. ඒ වගේම මේ සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම නිසියාකාරව සිදුවුනාද කියලා පසු විපරමක් කරන්න ඕන. ඉදිරියෙදිවත් ඒක සඳහා යම් ක්‍රමවේදයක් භාවිතා කරන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ සභාවේ සමහර සේවකයන් ගැන පුංචි කතාවක්. මේක කියලත් බැහැ. නොකියත් බැහැ. නමුත් සමහර සේවකයො මම දැකල තියෙනවා. වාහනේ රියදුරු මහත්තුරු, සමහර සුලු සේවකයො වාහනේ යනකොටත් රියදුරා එහෙම හැමෝම නෙවෙයි. අදාල අය භාරගත්තට කමක් නැහැ. අපි ඒක කියන්න ඕන. සිගරට් එක පත්තු කරගෙන තමයි වාහනේට ගොඩ වෙන්නෙ. පාර දිගේ යනවා අපටත් ඕන තරම් මුන ගැහෙනවා. එහෙම තමයි යන්නෙ. ගිහිල්ලා ආයතනයේ වාහනෙන් බැහැලා කෙනෙක් එක්ක කතා කරන්නෙ. නැත්නම් ආයතනයේ ටී ෂර්ට් එක ඇඳගෙන, රාජකාරි වෙලාවෙ ඒ අයගෙ හැසිරීම මීට වඩා පොඩ්ඩක් වෙනස් වෙනවනම් හොඳයි. මොකද මම නිරන්තරයෙන්ම දකින දෙයක් ඒක. මම හිතන්නෙ, ඔවුන්ට සේවක රැස්වීම් වලදි යම් දැනුවත් කිරීමක් කරනවනම්, වැදගත් වෙනවා. මොකද අපි එලියට ගියාම වෙන සභාවල දකින එකයි, අපේ සභාවේ අය දකින එකයි වෙනස්. නෙළුවෙ ඉදල ගාල්ලට යන කෙනෙකුට දකින්න තියෙන්නෙ අමුතුම දෙයක්. තවලම, නෙළුව සභාවල කට්ටිය වෙනම කිට් ගහගෙන වෙන දෙයක් කරනවා. අපේ අය වෙන දෙයක් කරනවා. නමුත් ඒක මම හිතන්නෙ අපේ සභාවට එච්චර හොඳ නැහැ. ඒ ගැන යම් දැනුවත් කිරීමක් කරලා, ඔවුන්ට ඒ රාජකාරි වෙලාවේ ඊට වඩා වගකීම් සහගතව හැසිරෙන ලෙස උපදෙස් දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් ගෝනදෙනියෙ බෝ ගහ හන්දියේ ඉදලා බාර් හන්දිය දක්වා කොටස ඉතාමත් අනාරක්ෂිතයි. මම සභා වාර කීපයකදීම කතා කළා. ඒ වීථි පහන් ටික හයි කරල දෙනවනම්, ඉතාමත් වටිනවා. සභාපතිතුමනි, ගෝනදෙනිය අම්බලම හන්දියේ ඉදල බාර් හන්දියට වෙනකම් හැම තැනම පාරවල් කඩලා. සමහර දවස්වල ත්‍රීවිල් පෙරලෙනවා. ත්‍රීවිල් ගන්න බැහැ. බෝක්කුවලින් පල්ලෙහාට වැටුනම සමහර ස්ථානවල ක්‍රේන් ගෙනැල්ල තමයි ගත්තෙ. ඉතිං ඒ වගේ හැමදාම පාරවල් කඩනවා. ඒ මාර්ගයේ ඒ කොටස ඉතාමත් අනාරක්ෂිතයි. සභාපතිතුමනි, ඒකෙ වීථි පහන් ටික සවි කරන්න කියලා මම ඉල්ලීමක් කළා. ඔබතුමා ඒ ඉල්ලීම කරපු දාට පහුවදාම කණ්ඩායමක් එවල තිබුනා. නමුත් ඒ කණ්ඩායම ගිහිල්ලා කරල තිබුනෙ වෙන ප්‍රදේශයක. උඩුගම යන්න කිව්වට ඒ අය ඒක නෙවෙයි කරල තිබුනෙ. මොන කොට්ඨාසෙ වුනත් ඔය බාර් හන්දියෙ ඉදල අම්බලම දක්වා ප්‍රධාන මාර්ගය ඒ අනාරක්ෂිත කොටසෙ වීථි පහන් ටික සවි කරල දෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මම මේ කියපු ඉහත සඳහන් ඒ කාරණා සියල්ල ගැන ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා, ඉදිරි සතියෙ ඉදලවත් ඒ සඳහා ගන්න පුලුවන් උපරිම ක්‍රියාමාර්ග ගන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඩ වෙනවා. බොහොම ස්තූතියි.

### ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ රංජිත් ජයවීර මන්ත්‍රීතුමා සභාවෙ වැඩ කරන රංජි මහත්මය පිළිබඳව කරපු ප්‍රකාශය නිවැරදි නැහැ. ඒ නිසා ඔහුට පොඩි පිළිතුරක් දිය යුතුයි.

සභාපතිතුමනි, රංජි මහතා නිරෝධායනයට දාලා, පී.සී.ආර් එකත් කරලා, දවස් දෙකකින් ඒ කොලේ ඉවත් කරල තියෙනවා. දවස් 14 ක් හිටියොත් තමයි බඩු මල්ල හම්බ වෙන්නෙ. මොකද ඒ ගෝනදෙනිය ප්‍රදේශයේ නිරෝධායනයට දාපු කෙනෙක් ආශ්‍රය කළා කියල තමයි මොහුත් නිරෝධායනයට යොමු කරල තියෙන්නෙ. ගෝනදෙනියෙ ප්‍රදේශයේත් නිරෝධායනය දවස් දෙකකින් ඉවත් කළා. මෙතනත් දවස් දෙකකින් ඉවත් කළා. එතකොට සභාවෙන් කියල තියෙනවා. දවස් 14 ඉන්න කියලා. සභාවෙන් කියල මිසක් පී.එච්.අයි මහත්තයවත්, ග්‍රාම නිලධාරීවත් කියපු දෙයක් නෙවෙයි. හැමදාම වගේ ජනතා විමුක්ති පෙරමුණ පොඩි දෙයක් අල්ලගෙන වැරදි දේවල් කතා කරනව වගේ, මේකත් සම්පූර්ණ තොරතුරු නොදැන කතා කරන්නෙ. අර ජැටිය සම්බන්ධවත් කතා කළා. ඒක දෙන්න බලාපොරොත්තු වෙලා නැහැ. ඒක දෙන්නෙ නැහැ. ඒ දවස්වල කට වහගෙන හිටපු අය දැන් කතා කරනවා. මෙන්න හොඳම උදාහරනෙ මේ රංජි මහත්මයගෙ ප්‍රශ්නෙ. මේ බොරු දේවල් අල්ලගෙන චෝදනා කරන්න එපා කියල ගෞරවයෙන් ඉල්ලනවා.

### ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා

බොරු චෝදනා කරනවයි කියලා. ජනතා විමුක්ති පෙරමුණට ඔබතුමා එහෙම කියන්න එපා ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා වැරදියි එහෙම කියනවනම්. අපි කවදාවත් වැරදි දෙයක් කිව්වෙ නැහැ. අපි කිව්වෙ මේ බෝඩ් එක ගහල තියෙද්දි එහෙම දෙන්න ඕන. ඔබතුමා මේ වැරදි විදිහට කියන්න එපා. ජනතා විමුක්ති පෙරමුණ කවදාවත් එහෙම කරන්නෙ නැහැ.

### ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මේ වෙලාවෙ මම දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මොකද අවස්ථාවෙ හැටියට මම හිතනවා අපි මේ රැඳී සිටීමත් දීර්ඝ වැඩියි කියලා. ඒ කොහොම වුනත් පුංචි ප්‍රශ්න දෙකක් තියෙනවා. මම එක පැත්තකින් කියනවා. අපේ ජයවීර මන්ත්‍රීතුමා රටේ පවතින පොදු ප්‍රශ්නයක් කතා කෙරුවෙ. එතුමා දින ගණන දන්නෙ නැතුව ඇති. එතුමා බෝඩ් එක බැලුවා, මේ නිවස නිරෝධායනය කරලා තියෙනවා. ඒ අයිතිවාසිකම් පිළිබඳව කතා කළේ. මම දන්නෙ නැහැ එතනින් එහා දින ගණන. කොතනද පරීක්ෂා කිරීම තුල සත්‍යය එළියට ආවා. ඒක තමයි වෙන්න ඕන. ඒක හොඳයි ඒක නිවැරදි වීමක් තමයි වෙන්න ඕන. ඒක නිසා ඒ අයිතිය මේ ඕනෑම මන්ත්‍රීවරයෙකුට කොතනක හෝ අඩුපාඩුවක් දැක්කහම කතා කිරීමේ අයිතිය තියෙනවා. සමහර විට ඒ කරුණ 100% ක් නිවැරදි වෙන්න පුලුවන් කතා කිරීම තුලින් තමයි ඒක නිවැරදි වෙන්නෙ. ඒක නිසා ඒ පිළිබඳ මම දීර්ඝ වශයෙන් තවත් කරුණු දක්වන්න යන්නෙ නැහැ.

කොරෝනා ප්‍රශ්නය නිසා සිදු කල යුතු විෂබීජහරණ කටයුතු පිළිබඳව අපේ තරංග මන්ත්‍රීතුමා කිව්වා. මම හිතනවා ඒක ලොකු වගකීමක්. ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව සභාවට ලොකු වගකීමක් තියෙනවා. විශේෂයෙන් මේ ප්‍රදේශයේ, මේ වෙලාවෙ, මේ වසංගතය වෙනුවෙන් පෙනී සිටීමේ ප්‍රධාන දායකත්වය සභාව හැටියට අපි දරන්න වෙනවා. එතනදි අපට සේවක ප්‍රශ්නය ඇත්තටම බලපානවා. මම මෙතනදි ස්තුතියක් කරනවා. කාටද? වනමල් මන්ත්‍රීතුමා අප ආයතනයේ අපේ මන්ත්‍රීවරයෙක් හැටියට ඉන්න කොට, ඔහුගේ නිවසේ විශබීජහරණය කරන්න සිදු වන වෙලාවෙදි සභාපතිවරයත් අසරණ වෙනවා. නමුත් මේ වෙලාවෙ ඒක දීර්ඝ වශයෙන් අපි සාකච්ඡා කරගෙන යන කොට, සභාවෙ මන්තීවරයෙකුට ඒ විශබීජහරණය කරන්න මම හිතන්නෙ දවස් පහක් හයක් ගියා. එතකොට විශබීජ පැතිරිලා ඉවරයි. වෙන්න ඕන දේ වෙලා ඉවරයි. මම හිතන්නෙ කෝකටත් තෙලෙ වෙලා ඉන්න පී.කේ. නිශාන්ත කියලා කම්කරු මහත්මයෙක් සභාවෙ ඉන්නවා. විදුලිය නැතිවුනත් ඒක හදන්නත්, මේසන් වැඩකට ඕනනම් ඒකටත් ඔහු යවනවා. මෙතනදි කවුරුවත් ඉදිරිපත් නොවෙන කොට, සභාපතිතුමා කිව්වහම, ඒ නිශාන්ත මහත්මය ඉදිරිපත් වෙලා තියෙනවා. සමහර වෙලාවට එයාටත් අයිතියක් නැති වෙන්න පුලුවන්. නමුත් ඒ සිද්ධිය ඉටු කිරීම ගැන ඒ

මහත්මයට මම බොහොම නිහතමානීව ස්තූතිය පුද කරනවා. නමුත් අපේ වගකීමක් තියෙනවා. විශේෂයෙන්ම සභාපතිතුමාට වගකීමක් තියෙනවා. මම හිතනවා ඔබතුමා මේ අඩුපාඩු තියෙනවනම්, ආණ්ඩුකාරතුමාට කියලා, ප්‍රදේශයේ සෞඛ්‍ය ආරක්‍ෂා කිරීම සඳහා, මේ වසංගතය පිළිබඳව කටයුතු කරයි කියලා. කොවිඩ් වසංගත තත්වය තුල අද නාගොඩත් යම් කිසි ස්ථානයක ඉන්නවා. අපේ වාසනාවට වනමල් මන්ත්‍රීතුමාගෙන් ඉදිරියට ගියේ නැහැ. නැත්නම් වනමල් පොකුරකුත් හැදෙනවා. ඒ පොකුර හැදුනෙ නැහැ. ඒක නිසා අඩුපාඩු තියෙනවනම්, ඒ විශබීජහරණය කිරීම නාගොඩ විද්‍යාලෙ විතරක් නෙවෙයි මම හිතනවා. අපට අයිති සියලුම පොදු ස්ථානවල ඒ කටයුත්ත කරන එක අපේ ප්‍රදේශය තුල මේ වසංගතය මර්ධනය කිරීමට පිටුවහලක් වෙනවා. ඒකෙ ලකුණක් වැටෙනවනම්, ඒකෙ ජයග්‍රහනයක් ලැබෙනවනම්, ප්‍රධාන ස්ථානය වෙන්නෙ ප්‍රාදේශීය සභාව. තමුන්නාන්සෙගෙ පරිපාලනය තුල තියෙන්නෙ. අන්න ඒක නිසා මම හිතනනවා මේ විශබීජහරණයට අපේ මන්ත්‍රීතුමා කිව්ව වගේ මීට වැඩිය අවස්ථාව ලබා දිය යුතුයි. වාහන තියෙනවා. පහසුකම් නැත්නම් තමුනාන්සෙලගෙ ආණ්ඩුවක්, තමුනාන්සෙලගෙ ආණ්ඩුකාරවරයෙක්, සියලු දෙනාම ඉන්නෙ තමුනාන්සෙලගෙ. ඉල්ලීමක් කරන්න. ඉල්ලීම කරලා, අපි මේ වසංගත උවදුර මේ ප්‍රදේශයෙන් ඈත් කරන්න කටයුතු කරමු. ඒ සඳහා අපි සියලු දෙනාගෙම සහයෝගය ලැබෙනවා.

ඊලගට අපිට තමුනාන්සෙගෙන් ලැබෙන්නෙ කුඩම්මගෙ සැලකිල්ල තමයි. තමුනාන්සෙ දැන් යෝජනා මන්ත්‍රීවරු 15 දෙනා අතරෙ බෙදල දුන්න අපේ කිසි කෙනෙක් නැහැ. නමුත් අපි මන්ත්‍රීවරු හැටියට, ප්‍රදේශයේ නියෝජිතයො හැටියට, තමුන්නාන්සෙලගෙ දායක පංගු කාරයො වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු තුන් දෙනාටවත් මොනව හරි යමක් දෙන්න කියල මම යෝජනා කරනවා. එතුමන්ලාටවත් නැති කොට අපට මොන කතාද කියන එක විතරයි මම මෙතනදි කියන්නෙ.

ඊලග ප්‍රශ්නෙ තමයි. උඩවැලිවිටියෙ ජල යෝජනා ක්‍රමය ගැන කතා කරනවා. අපේ මන්ත්‍රීවරියොත් ඉන්නවා. මන්ත්‍රීවරුත් ඉන්නවා. මම දන්නෙ නැහැ මේ මොහොත වෙන කොට ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වෙලා, ඒක තහංචි ඉවත් වෙලා, දැන් ප්‍රදේශයට ජලය ලැබෙනවද කියන එක. මේ වෙලාවෙම මම ඒ ගැන තොරතුරු දැනගන්න කැමතියි. එහෙම වෙලා තියෙනවනම්, මොකද ඒ පිළිබඳව මේ සභාවාරයේ මම කතා කරන්නෙ නැහැ. මම හතරවෙනි අවස්ථාව වගේ මේ කතා කරන්නෙ. ඒක සිදු වෙලා නම්, මම කතා කරලා, මගේ වචන හිස් බස් වෙනවා. ඒක නිසා ඒ මන්ත්‍රීවරුත් උනන්දුවක් නැහැ. මම ඒකත් කියනවා. අපේ කණ්ඩායමවත් මේ කණ්ඩාමේය කියලවත්, ඒ දෙපළටම මම සුදු හුනු ගාන්නෙ නැහැ. මේක දැන් අපි පුරා මාස හතරක් පහක් කතා කරනවා. අපේ පොදු වස්තුවක්. තනි පුද්ගලයෙක් මංකොල්ල කාල වගේ තියෙන්නෙ. ඒ නිසා ඒ උදවිය කතා කරන්නෙ නැත්තෙ මොකද කියල දන්නෙ නැහැ. ප්‍රදේශයට ගියාම ජනතාව කතා කරනවා. ඒක නිසා ඒක තමුන්නාන්සෙගෙ පූර්ණ අධීක්‍ෂණය යොදලා, මේ කටයුත්ත නිරවුල් කරන හැටියට මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මීට වැඩිය මම කාලය ගන්නෙ නැහැ. තමුන්නාන්සෙ දැන් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, පොදු පෙරමුණේ අපේ මන්ත්‍රීවරුන්ට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂෙ අපේ අජිත් හිටපු සභාපතිතුමාට හිතෙනව ඇති. එදා අයවැයට විරුද්ධ වුනානම් මීට හොඳයි කියලා. දැන් ආව නේද යෝජනා එකක්වත් තියෙනවද? එතුමන්ලා මට කිව්ව තියෙන හැටි. ඒක නිසා කණගාටු වෙනවා. ඒක නිසා අපි කියන්නෙ මේ 27 දෙනාම එක හා සමානයි. මෙතුමන්ලටත් ඒ සැලකිල්ල කරන්න. යම්කිසි ප්‍රශ්නයක් වුනාම, සභාව වෙනුවෙන් හඩක්, අපි විපක්ෂෙයි කියල බලන්නෙ නැහැ. නාගොඩ සභාව ආරක්‍ෂා කරන්න තැන හෝ නොතැන කොතනද කියල බලන්නෙ නැහැ. අපි අමාරුවෙ වැටුනොත් වැටිච්ච තැනදි 27 දෙනාම කෙලින් හිට ගන්නවනම්, ඒ 27 දෙනා වෙනුවෙන් මම හිතනවා ඔබතුමන්ලගෙන් එක් අයෙකුට ලක්‍ෂ දෙකක් දෙන කොට එතුමන්ලගෙ යෝජනාවකටත් අඩුම ගානෙ රුපියල් 50000 ක් වත් දෙන්න කියලා. ඒක තමුන්නාන්සෙගෙ

වගකීමක්. තමුන්නාන්සෙගෙ වගවීමක්. ඒක නිසා අපි මෙතන කවදාවත් මොන ආරවුල සිද්ද වුනත්, බොහොම සමගි සම්පන්නව, ප්‍රදේශයට ආදර්ශමත් සභාවක් හැටියට කටයුතු කරල තියෙනවා. ප්‍රදේශයේ අනිත් සභා දිහා බලන කොට, අපි ඉතාමත් වැදගත් මන්ත්‍රීවරු විදිහට කටයුතු කරලා තියෙනවා. ඒ ගෞරවය තමුන්නාන්සෙට දීමේ අයිතියක් තියෙනවා. තමුන්නාන්සෙට සමහරවිට බලපෑම් එනවා ඇති. මොන බලපෑම ආවත්, තමුන්නාන්සෙට කියන්න පුලුවන් නැහැ ඒ සහයෝගය තියෙන නිසා මට මේ කටයුත්ත කරන්න සිද්ද වෙනවයි කියන එක. මේ එන්නෙ පොදු අරමුදල්. අපේ සල්ලි. අපේ බනිස් ගෙඩිය කන එක පාන් ගෙඩිය කන එක ඒ බදු මුදලින් තමයි මේ තමුන්නාන්සෙලට සංවර්ධනය සඳහා බෙදන්නෙ. ඒක නිසා ඒ ගැන මීට වඩා සැලකිල්ලක් තමුන්නාන්සෙ දක්වනවා ඇතෙයි කියලා බලාපොරොත්තු වෙමින්, ලැබුවා වූ නව වර්ෂය සියලු දෙනාම මේ වසංගත රෝගයෙන් බේරිලා, මේ සඳහා ඉක්මනින්ම අපට විසඳුමක් ලැබිලා, ඒ වගේම රජය විසින් ඒ කරන්න ඕන එන්නත ඉක්මනින් ලබා දීලා, රටේ මේ වසංගත වුවදුර ඉක්මනින්ම දුරුවේවායි ප්‍රාර්ථනය කරමින්, සියලුම දෙනාට සුබ නව වසරකට ආසිරි ගෙනෙමින්, මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමනි, ඒ වගේම සියලුම මන්ත්‍රීවරුන්ට සහ සභාවේ සියලුම නිලධාරීන්ට සුබ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින්, පළමුවෙන්ම මම සමාව හජනය කර සිටිනවා. මොකද මට සභාවට නිසි වෙලාවට අද පැමිනෙන්න බැරි වුනා. ඒකට හේතුව තමයි කුඹුරු ගොඩ කිරීමක් වෙනුවෙන් නඩු පැවරීමක් කරලා තියෙනවා. අද දවසේ තමයි ඒ නඩුව විභාග කිරීමට තිබුනෙ. ඒ නිසා බද්දෙගම උසාවියෙ ඉදල තමයි මට එන්න සිදු වුනේ. මම කෙලින්ම පටන් ගන්නවා. අපේ ජයවීර මන්ත්‍රීතුමා කුඹුරු ගොඩ කිරීම පිළිබඳව මතු කළ ප්‍රශ්නෙදි, මම හිතන්නෙ මේ වකවානුව තුල කුඹුරු ගොඩ කරනවද කියන එක. ජයවීර මන්ත්‍රීතුමා එහෙම කියනවනම්, මේ වෙන කොට ඔබ ප්‍රදේශයේ කුඹුරු ගොඩ කිරීමක් පිළිබඳව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දැනුවත් වෙලා නැහැ. මොකද කුඹුරු ගොඩ කිරීම් සම්බන්ධව මේ වෙන කොට නව පනත් සංශෝධනය වෙලා තියෙනවා. මේ විදිහට බී කාණ්ඩයේ කුඹුරුවල පුලුවන් වෙනත් වගාවන් සඳහා ඉල්ලුම් පත්‍රයක් දාලා අවුරුදු තුනක වගාවන් සඳහා ඔය සෝජාන් ක්‍රමය වගේ ක්‍රමවේදවලට, ඒ කුඹුරු හිමියට වගා කිරීමට නොහැකි නම්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව නිර්දේශ කරනවනම්, ඒ බී කාණ්ඩයේ කුඹුරුවල එවැනි වගා කිරීමට පුලුවන්.

ඊලගට සී කාණ්ඩයේ කුඹුරක් හැටියට ඒ වගා කටයුතු පිළිබඳව ඒ ප්‍රදේශය භාරව ඉන්න කෘෂනිස වරයා හෝ වරිය සඳහන් කරලා, ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට වාර්තා කරල තියෙනවනම්, ඒ කුඹුර ගොඩ කිරීමට හෝ තමන්ට අවශ්‍ය කටයුත්තක් කර ගැනීමට හැකියාව තියෙනවා. ඒ නිසා ජයවීර මන්ත්‍රීතුමා නැගූ ප්‍රශ්නය මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. පුලුවන්නම් ඔබතුමා ලිඛිතව මේ ප්‍රශ්නය ගොවිජන සේවා සංවර්ධන කමිටුවට යොමු කරන්න. කුඹුර ගොඩ කිරීම ඉතාමත් හානි දායකයි. මොකද මම එදා සංවර්ධන කමිටුවෙදිත් කිව්වෙ සෝජාන් ක්‍රමයට වුනත් වගා කිරීමටනම් මම කැමති නැහැ කියලා. මම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ඉන්නකම්, ඒ වගා කළ හැකි කුඹුරක් නම්, මම අවස්ථාව ලබා දෙන්නෙ නැහැ. මොකද සෝජාන් ක්‍රමය කියන්නෙත් කුඹුරු ගොඩ කිරීමක්. නැවත කුඹුරක් වෙන්නෙ නැහැ. අපේ ප්‍රදේශයේ මම අක්කර පහක ප්‍රමාණයක් සෝජන් ක්‍රමයට වගා කරන්න හදල තියෙන්නෙ. දයානන්ද වීරසිංහ මහත්මයා විසින් ඇල මාර්ගයක් වහලා වසර15කට 20 කට ආසන්න කාලයක් වෙනවා. අදටත් ඒ නඩු විභාගයට තමයි ගියේ. නමුත් මේ අපේ ආණ්ඩුව නෙවෙයි. මීට පෙරාතුව තිබුන ආණ්ඩුයි, හැම එකකම, දැන් අවුරුදු 20 ක්ම මම කුඹුරු නඩු කිය කිය හැම සංවර්ධන කමිටුවකම කතා කලත්, මේ ඇල මාර්ගය නැවත අපට තිබුන තත්වයට පත්කර ගන්න බැරි නීති රාමුවක් තමයි මේ රටේ තියෙන්නෙ. එතකොට මේ අද ගිහිපු නඩුව 2012 දාල තියෙන්නෙ. මේ නඩුවට අදට අවුරුදු 10 ක් වෙනවා. එතකොට මේ නඩුවට යන

නිලධාරීන්ටත් දැන් එපා වෙලා. ඒ හිටපු නිලධාරි පෙන්ෂන් ගිහිල්ලා. ඒ නිලධාරීන් ගෙන්වා ගැනීමේ අපහසුතාවයන්ට පත් වෙලා තියෙනවා. ඒ සාමාන්‍ය කුඹුරු ගොඩ කිරීමක් පිළිබඳව වසරකට හෝ වසර දෙකකට හෝ තුනකට ආසන්න කාලයකදී මේ නඩුව ඉවර වෙන්න ඕන කියලා නීති සකස් කරලා තියෙනවනම්, මේ කුඹුරු ගොඩ කරන අය ඒක නවත්වලා. ඒවට දඩුවම් දීලා. ඒ කටයුතු කරන්න පුලුවන්. දැන් මේ නඩුව විභාග වෙමින් වසර 20 කට වැඩිය වෙනවා. මේ යාය අක්කර 100 කට වැඩිය පුරන් වෙලා තියෙනවා. අන්න ඒ නිසා තමයි මම ඒක සෝජාන් ක්‍රමයට වගා කරීමට අවුරුදු තුනකට අවස්ථාව ලබා දුන්නෙ. මොකද අපට නිසි කාලෙකදි යම් විසඳුමක් ලැබුනොත්, ඇල මාර්ගය ඇල පිළිසකර කර ගන්නකම්, මේ කුඹුරු අපරාදෙ. මිනිස්සුන්ට වගා කරගන්න බැරි නිසා සෝජාන් ක්‍රමයට වගා කරීමට අවස්ථාව ලබා දීල තියෙනවා. ඉතිං එම නිසා කුඹුරු ගොඩ කිරීමක් තියෙනවනම්, ගොවිජන සේවා එක දැනුවත් කිරීමට මන්ත්‍රීවරු කටයුතු කරනවනම් හොඳයි. මොකද ගොවිජන සේවා එකේ සමහරක් වෙලාවට නිලධාරි සම්බන්ධ වෙලා කරන ඒව තියෙන්න පුලුවන්. හැබැයි මන්ත්‍රීවරයා විරුද්ධ නම්, ඒ වගේම ගමේ මිනිස්සු විරුද්ධනම්, මිනිස්සුන්ට එකෙන් අයහපතක් සිද්ද වෙනවනම්, යායට අයහපතක් සිද්ද වෙනවනම්, ඒව දැනුවත් කිරීම ඔබගේ වගකීමක් හැටියට මම සිහිපත් කරනවා.

ඊලගට ඔබේ වගකීමක් වෙනවා. දැන් මම ගරු සම්පත් අතුකෝරල මැතිතුමන්ගේ මැදිහත් වීම මත වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතුව, ඒ පුරන් කුඹුරු ප්‍රදේශ හඳුනාගෙන ඒ ගැටලු ඒ කුඹුරු ඉඩම් හිමියන් සමග සාකච්ඡා කරලා, ඒ අයට අවශ්‍ය පරිදි, සමහර වෙලාවට මේ පැරනි ඇල මාර්ග තියෙනවා. ඒ ඇල මාර්ගවලින් වතුර බස්සන්න බැහැ. මොකද ඒ ඇල මාර්ග කුඹුරට වැඩිය ඉහලින් තියෙන්නෙ. සාමාන්‍යයෙන් භූ ගත ජලය සිදීමත් සමග, ඒ පැරණි වාරිමාර්ග කුඹුරට වැඩිය ඉහලින් තියෙන්නෙ. එතකොට අපි නැවත වාරිමාර්ග ක්‍රම හදල දෙන්න ඕන. එතකොට අපි එතනදි අපි තීරණය කරන්න ඕන. මෙන්න මෙතනින් ඇලක් කැපුවොතින් මේ ඇලේ වතුර බස්සන්න පුලුවන්. එතකොට මේ හැල් කුඹුරු, ගොඩ කුඹුරු බවට පත් කරන්න පුලුවන්. මොකද අද මිනිස් ශ්‍රමයෙන් කුඹුරු වැඩ කරන්න බැහැ. යන්ත්‍ර උපකරණ භාවිතා කරන කුඹුරක් විතරයි අද මිනිස්සුන්ට කරන්න පුලුවන්වෙලා තියෙන්නෙ. මොකද ගොයම් කපන්න සාමාන්‍ය මනුස්සයෙකුගෙ අත්තම රුපියල් 1500 කට එහා ගන්නවා. නමුත් වී කුරුණි දෙකක ගොයම් කපන්න බැහැ. එතකොට ඒ ගොයම් එකතු කරන්න ඕන. පාගන්න ඕන. එහෙම වෙන කොට අද වී ගොවිතැන මේ ප්‍රදේශයේ සාමාන්‍යයෙන් ගොඩක් පාඩු ලබන බෝගයක් බවට පත්වෙලා තියෙනවා. ඒක නිසා එම කුඹුරු යන්ත්‍ර උපකරණ පාවිච්චි කරලා කරන්න පුලුවන් තත්වයට පත්කර දීම ඔබේ වගකීමක් වෙනවා. ඔබ මහජන නියෝජිතයො වශයෙන් මම ඉල්ලීමක් කරනවා. අපේ මන්ත්‍රීවරුන් සහ විපක්ෂ මන්ත්‍රීවරුන්ගෙන්, තමන්ගෙ ප්‍රදේශයේ තියෙන කුඹුරුවල ඒ වාරිමාර්ග පද්ධති නැවත පිළිසකර කර දීලා, ඒ පුරන් කුඹුරු අස්වැද්දීමට යොමු කරන්න කියලා. ගොවි මහත්වරු සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කරලා, එහෙම නැත්නම් ඔබට අවශ්‍යතාවයක් තියෙනවනම්, අපි වුනත් අපේ ප්‍රදේශයේ, නාගොඩ ප්‍රදේශයේ අපි එන්නම් අපි ඕන වෙලාවක ඒ වෙනුවෙන් කැප වෙලා ඉන්නවා.

ඊලඟට මෙතනදි ගොඩක් කතාවට ලක් වුන එකක් තමයි මාගේ සහෝදර මන්ත්‍රීවරයෙක් හැටියට අපේ ප්‍රදේශයේ හිටිය වසන්ත කුමාර මන්ත්‍රීතුමාගේ නිවසේ ඇති වුන සිද්දිය පිළිබඳව. ඒක ලොකු කතබහකට ලක් වුනා. මම එතනදි සිහිපත් කරන්න ඕන. එතුමා දැනුවත්ව නෙවෙයි මොන දෙයක්වත් සිද්ද වුනේ. අපි කවුරුවත් දන්නෙ නැහැ. මොකද ගම තුල එහෙම විවිධ චෝදනා එතුමා වෙනුවෙන් ගොඩ නැගුනා. මම මේ වෙලාවෙදි එතුමාගේ පවුලේ ඇතිවෙච්ච සිද්ධිය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කර සිටිනවා. මොකද එතුමා පුදුම අපහසුතාවයට පත් වුනා. අපේ ප්‍රදේශයේ නිරෝධායන ගෙවල් ආශ්‍රිතව 42 ක් පළවෙනි වටයට නිරෝධායනය කළා. මගේ කොට්ඨාසෙ තිබුන සෑම ගෙදරකටම මම ගිහිල්ලා කෑම පාර්සලයක් දීලා, ඒ අයගෙ දුක සැප සොයල බලලා, ඒ අයට මොකක්ද වෙන්න ඕන කියල බැලුවම, ඉතිං බඩු මල්ලෙ පොල් නැහැ. ඒ අවශ්‍ය සෑම නිවසකටම

මම පොල් ගිහින් දුන්නා. ඉතිං ඒ වගේ මන්ත්‍රීවරු හැටියට එකමුතු වෙලා ඒ කටයුත්තෙදි ඒකට මුහුන දෙන්න අපට සිද්ද වුනා. ඉතිං මම මෙතනදි ඒ නිරෝධායන වැඩ කටයුතු කරද්දි, ඒ වගේම පී.සී.ආර් පරීක්‍ෂණ කිරීමෙදි, සභාවේ සහයෝගය මම දැක්කා. ඉතාමත්ම හොඳට සහයෝගය ලබා දුන්නා. පොදු කටයුතු තැනක් හැටියට, අපේ ප්‍රදේශයේ විපුලසාර මන්දිරය තමයි අපි තෝර ගත්තෙ. ඒකෙ එලිමහන් ක්‍රීඩාංගනය ගත්තා. ඒ පී.සී.ආර් පරීක්‍ෂණ කිරීමට එතනට ඒ අවශ්‍ය කරන ජල පහසුකම් මම ලබා දුන්නා. ඒ වගේම මේ සභාවේ රංජිත් මහත්මා මේ දවස් කීපයයේදිම ඒ විශබීජහරණය කිරීමේ කටයුතුවලට සහයෝගය ලබා දුන්නා මම දැක්කා. ඒ පිළිබඳව මම ඒ පැමිණි සියලු දෙනාට ස්තුති වන්ත වෙනවා. හැබැයි සභාවෙ ගොඩක් අඩුපාඩු තියෙනවා. නමුත් අපේ ගමේ මේ වෙච්ච වියසනයෙදි ඒ සියල්ලට අත්වැල් බැඳගෙන උදවු කිරීම පිළිබඳ මම සභාවට ස්තුති වන්ත වෙනවා. ඒ වගේම මම ඔබෙන් ඉල්ලා සිටිනවා. නැවත එවැනි කටයුත්තක් අපට සිද්ද වුනෝතින්, මන්ත්‍රීවරු හැටියට අපට ඒ ගෙදරට යන්න බැහැ. නමුත් මගට ගිහිල්ල හරි අපි දුක සැප හොයල බලන එක අපේ යුතුකමක් වෙනවා. හැබැයි කිසිම කෙනෙක් අපෙන් ඇහුවෙ නැහැ. ඔබේ ගමේ නිරෝධායනය කරලා විශාල පිරිසක් ඉන්නවා නේද? මොනවද අපෙන් වෙන්න ඕන කියලා. ඒ ගැනනම් මම ඇත්තටම කණගාටු වෙනවා. මොකද වනමල් මන්ත්‍රීතුමාගෙන්වත් ඇහුවද දන්නෙ නැහැ. මම නම් පැනියක් කියන එක සමහර වෙලාවට පිළිගන්නෙ නැතුව ඇති. විශේෂඥ වෛද්‍යවරයෙකුට ලැබුණු පැණි බෝතල් පහක් තියෙනවයි කියලා මම ගමට ගෙන්නලා ඒක පවා එතුමාට ලබා දෙන්න කටයුතු කළා. පරණතානායම්ගොඩ ප්‍රදේශයේ මේකෙ මූලාශ්‍රය බවට පත් වුනේ. එතකොට ඔබ ඇත්තටම මගෙන් ඇහුවනම් පොඩ්ඩක් හරි මොකක්ද මන්ත්‍රීතුමා වෙන්න ඕන කියලා, කොච්චර සතුටුද. මොකද මේ වගේ වසංගතයක් ආවයින් පස්සෙ නිහඩ වීම නෙවෙයි වෙන්න ඕන. ඒ වගේ එකතුවෙලා කතා බහ කළානම්, කොච්චර හොඳද. හැබැයි කීයක් පොසිටිව්ද නෙගටිව්ද කියලනම් මගෙන් ඇහුවා. පළවෙනි නව දෙනා පරීක්ෂණයට ලක්කළාට පස්සෙ අපේ වසන්ත මන්ත්‍රීතුමාගෙ දරුවො තුන් දෙනාට විතරයි තිබුනෙ. ඇත්තටම පුදුම දුක හිතෙන කතාවක් එතනදි සිද්ද වුනෙ. මොකද ඒ ළමයි තුන්දෙනා අරගෙන යද්දි එතුමා සහ දරුවො ඇඩුව විදිහ දැක්කයින් පස්සෙ, අපිට ගොඩක් දුක හිතුනා. ඉතිං දෙවනි පී.සී.ආර් එක කළා 42 දෙදෙනෙක්ගෙ. ඒ 42 දෙදෙනත් නෙගටිව් වුනා. ඊට පස්සෙ 94 දෙනෙක්ගෙ කළා. ඒ සියලු දෙනාම නෙගටිව් වුනා. ඉතිං ඇත්තටම අපි සතුටට පත් වෙනවා. මොකද මේ වගේ ලොකු ව්‍යසනයක් වෙන්න ගිහිල්ලා ඒකෙන් බේරිච්ච එක පිළිබඳව. මොකද අපි සභාව එකතුවෙලා දානමය කටයුත්තක් කළා. ඒ වගේම පෙරපාසල සමග සම්බන්ධ වෙලා අපි වැඩ කටයුත්තක් කළා. ඒකට පෙරපාසලට ලොකු විවේචන ඇවිල්ල තිබුනා. ගරු සභාපතිතුමනි, මම ඒක ප්‍රතික්ෂෙප කරන්න ඕන. මොකද පී.එච්.අයි මහත්තය පෙරපාසල් පාලිකාවට අසභ්‍ය විදිහට දෝෂාරෝපනය කරල තිබුනා. ඔබතුමා ඒ පිළිබඳව සාමාන්‍යයෙන් හොයලා, පෙරපාසල් ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න. මොකද ඒ කතා කරපු විදිහ මම ඇත්තටම මෙතනදි හෙලා දකිනවා. මොකද මගේ ප්‍රදේශයේ ඉන්න පෙරපාසල් ගුරුතුමියට ළමයි නැති වුනාට, ඒක පී.එච්.අයි මහත්තයට අදාල ප්‍රශ්නයක් නෙවෙයි. අන්න ඒ වගේ කතා කරලා දෝශාරෝපනය කරල තිබුනා. ඒකට විනය පරීක්‍ෂණයක් කරනවයි කියල තිබුනා. නමුත් ඒක එයාට කරන්න පුලුවන් දෙයක් නෙවෙයි. ඒක ඔබතුමාට තමයි විනය පරීක්‍ෂණයක් කරනවනම් කරන්න පුලුවන් වෙන්න ඕන. නමුත් පෙරපාසලේ පාලිකාතුමිය මේ සභාවෙ අවසරය ඇතුව මට ආරාධනා කළා. උත්සවයක් තියන්න එපයි කියල තියෙනවා. විසිර යන ළමයි ටිකට තෑග්ගක් දෙන්න කටයුතු කරන්න කියලා. මම තමයි වසන්ත මන්ත්‍රීතුමාව ගෙන්න ගන්න කිව්වෙ. මොකද හේතුව මගේ සහෝදර මන්ත්‍රීවරයෙක් හැටියට එතුමාව, ගමේ හිටිද්දි පෙරපාසලේ උත්සවය තියෙද්දි, අවුරුදු ගණනාවක් එතුමා තෑග්ග දීල තියෙනවනම්, මම පෙරපාසල් පාලිකා තුමිය ගෙන් ඉල්ලීමක් කළා එතුමාට එන්න කියන්න කියලා. නමුත් අපි දන්නෙ නැහැ එතුමාට ඔය වගේ වසංගතයකට මුහුන දෙන්න වෙයි කියලා. ඉතිං මගේ ඉල්ලීම පිළි අරගෙන තමයි පෙරපාසල් පාලිකාතුමිය වසන්ත මන්ත්‍රීතුමා එතනට ගෙන්න ගත්තෙ. එතනදි ගමේ අයට වැඩිය රාජ්‍ය නිලධාරීන් හැටියට දොස්

කියල තිබුනා. ඒ පිළිබඳව හොයා බලලා ඔබතුමා ඒකට යම් සහනයක් වෙනවනම් හොඳයි. එතුමියට ඒ බැනපු විදිහට, එතුමියට මේ වෙන කොට පෙරපාසල කිරීම පවා එපාවෙල තියෙන්නෙ. ඉතිං ඒකනිසා ඒවා එහෙම වෙන්න දෙන්න එපා. අපේ ගමේ මේ කටයුත්තෙදි අපි ඔක්කොම සහයෝගෙන් වැඩකටයුත්ත කර ගත්තා. සභාවෙන් දුන්න සහයෝගයට සහ කතා කරල මාත් එක්ක කතා කරපු මන්ත්‍රීවරු ඉන්නවයි කියනවනෙ, ඒ අයටත් මම ස්තූති වන්ත වෙමින්, එහෙනම් සියලු දෙනාට ලැබූ වසර සුබ වසරක් බවට පත්වේවා කියල ප්‍රාර්ථනා කරමි,න් නිහඬ වෙනවා. ස්තූතියි.

### ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් සහතා

ගරු සභාපතිතුමනි, චන්ද්‍ර සහබන්දු අපේ හිටපු සභාපතිතුමා කියපු උඩවැලිවිටියෙ ජල යෝජනා ක්‍රමය පිළිබඳ අපි සොයා බැලුවා. එතන ප්‍රශ්නයක් තියෙනවා. සභාපතිතුමත් මාත් එක්ක ගියා. ඒ වගේ ජල යෝජනා ක්‍රමයක් එම ස්ථානයේ නිර්මාණය කළාට හිටපු සභාපතිතුමා, ඔබතුමාට අපි ස්තූති වන්ත වෙනවා. හැබැයි සින්නක්කර ඉඩමක තමයි ඔය ජල යෝජනා ක්‍රමය ස්ථාපිත කරල තියෙන්නෙ. පොදු දෙයක් පෞද්ගලික ස්ථානයක හැදීම තමයි මේකෙ පළවෙනි විපාකෙ. අනිත් එක තමයි මෙහි විශාල කන්දකින් මේ වතුර ප්‍රමාණය පල්ලෙහාට බහින්නෙ. මේකෙ බට තියෙන්නෙ උඩින්. රිලවු, වඳුරො පැනලා බට හැමදාම ගැලවෙනවලු. ඔය බට හදන්න කවුරුවත් යන්නෙ නැහැ. ඒ සඳහා මේ පුද්ගලයම තමයි කන්දට ගොඩ වෙලා මේ බට ටික හදන්නෙ. ඒ වගේම ඔය කියන විදිහට එදා තිබ්බ ජල මූලාශ්‍රය අද නැහැ. ඒ නිසා අපේ සභාපතිතුමත්, අපිත් යෝජනා කළා. අපේ සම්පත් අතුකෝරල මැතිතුමත් එදා එතනට ගිහිල්ලා, අපි යෝජනා කරල තියෙනවා. ඒ ළිඳ හාරලා, ෆිල්ටර් කරලා,  ස්ථිර ක්‍රමයකට බට ටික ගෙනැල්ලා, ඒ ටැංකියත් එතනින් වෙනස් කරලා, වෙන ස්ථානයක ස්ථාපිත කරන්න. ඒ වගේම දැනට ඒ බටවලින් සත්තු පවා එනවා. පෞද්ගලික ඉඩමක ඇති නිසා දැනට අපි ලොකු අපහසුතාවයකට පත් වෙලා තියෙනවා. සභාපතිතුමාටවත් මොකුත් කරගන්න විදිහක් නැහැ. ඒතන ප්‍රශ්නයක් තියෙනවා. ඒක නිසා අපි කොච්චර හදල ආවත් අපට එතන ඉන්න බැහැ. අපට ගිහිල්ල මිදුල් හාරන්න බැහැ. ඒ නිසා ඒ වැඩේ ඒ පුද්ගලයා එතනින් කරගන්නවා. ඒ පුද්ගලයම පමණක් නෙවෙයි ඒ අවට තව කීප දෙනෙක් ඒ ජලය පාවිච්චි කරනවා. ජල මාර්ගය තව දීර්ග කරගන්න බැරිවෙලා තියෙනවා. ඒ දීර්ග කරගන්න බැරි හේතුවක් තියෙනවා. මොකද ජල මූලාශ්‍රය ජලය ටිකයි තියෙන්නෙ. ඒ නිසා ඉතාමත් ඉක්මනින් කුඩා ජල යෝජනා ක්‍රමයක් හැටියට සංවර්ධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපේ සභාපතිතුමාගෙ මූලාසන කතාවෙදි ඉතුරුටික ප්‍රකාශ කරාවි.

### ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව

ගරු උප සභාපතිතුමා ඇතුලු සමස්ථ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. අද ප්‍රාදේශිය සභාවෙ මාසික සැසි වාරය මේ ආකාරයෙන් ඉක්මනට අවසන් කරන්න බලාපොරොත්තු වුනේ. වර්ථමානයේ රටේ පවතින වාතාවරණය උඩ. මේ වන විට අපේ වනමල් මන්ත්‍රීතුමා කොවිඩ් ආසාධිතයෙකුගේ ආශ්‍රිතයෙක් වෙලා. එතුමා ජනවාරි පළවෙනිද ඇවිල්ලා, සභාවෙ දානෙටත් උදවු උපකාර කළා. මේ වන විට අපේ වනමල් මන්ත්‍රීතුමා ස්වයං නිරෝධායනයට ලක් කර තියෙනවා. එයට හේතුව එතුමාගේ බිරිඳ රැකියාව කරන්නෙ ගාල්ල බන්ධනාගාරයේ. එහිදී ඇයව PCR පරීක්ෂණයට ලක් කිරීම තුල එතුමියට කොවිඩ් ආසාධිත වී ඇති බව දැනගත් නිසා එතුමියගේ ගෙදර සියළු දෙනාම නිරෝධායනයට ලක් කර ඇති බව දැනගැනීමට ලැබුණා.  වනමල් මන්ත්‍රීතුමා ප්‍රදේශයේ සියළු අවශ්‍යතාවයන්වලදී  පක්ෂ භේදයකින් තොරව කටයුතු කරන නිසා, ප්‍රදේශයේ ජනතාව මේ වන විට සැකයෙන් ඉන්නෙ. මෙමගින් ගමට බලපෑමක් නොවේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා. මම දැනගත් විගසම වනමල් මන්ත්‍රීතුමාට දුරකථනයෙන් කතා කළා. පිළිතුරු නොමැති

නිසා පසුව කතා කලාම, යම් යම් අයගේ ඇතැම් මත ප්‍රකාශවලට අනුව ඔහුව මානසිකව යම් පසුබෑමකට ලක්වී ඇති බව වැටහුණා. එනිසා ඔබතුමාගේ බිරිඳ රාජකාරිය ඉටු කරන්න ගිහින් සිදු වූ දෙයක් බවත්, ඇය මෙම රෝගය ඕනෑකමින් බෝ කර නොගත් බවත්, මම ඔහුට ප්‍රකාශ කළා. ඒවගේම මම රෝගයට කුල මල, ජාති භේද, දුප්පත්, පොහොසත් බව නොසළකන බවත්, මේ වන විට ඇමරිකන් ජනාධිපති, ලංකාවේ ඇමරිකන් තානාපති ආදීන්ටත්, රට රටවල මැති ඇමතිවරුන්ටත්, වෛද්‍යවරුන්ටත් මෙම රෝගය වැළඳී ඇති බව පවසා ඔහුගේ සිත සැනසුවා. ගරු මන්ත්‍රීවරුනි, මෙම රෝගයේ රෝග ලක්ෂණ පිළිබඳව තවමත් අපි හරියට දැනුවත් නොමැතිකමින් මෙය කොයි මොහොතේ හෝ අපටද ලඟා විය හැකි නිසා අපි පුළුවන් තරම්, මෙම රෝගයෙන් ආරක්ෂා වන විදියට කටයුතු කල යුතු බව කියන්න ඕන. දේශපාලනය කරන අපට වැළඳුනොත්, වෙනත් අයට මෙම රෝගය වැළඳුනා වගේ නෙවෙයි. අපි ජනතාව වැඩිපුර ගැවසෙන ස්ථානවලට සම්බන්ධ වන නිසා. මළ ගෙවල්වල, මගුල් ගෙවල්වල වෙනත් උත්සව අවස්ථාවන් සඳහා අපට සම්බන්ධ වෙන්න සිදු වෙනවා. ඒවාට සහභාගි නොවුනොත් වැරදි වැටහීම් ඇතිවෙනවා. අපට යම් විදියකින් මේ රෝගය වැළඳුනොත් මුළු පළාතම Lock down කරන්න වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි පරිස්සම් විය යුතුයි.

මේ දිනවල වැඩියෙන්ම කොරෝනා ආසාධිතයන් හමු වන්නේ අහඹු පරීක්ෂණවලින්. ඒ අනුව පසුගිය දවසක තවලම පොළ ආශ්‍රිතව කරන ලද PCR පරීක්ෂණවලින් ආසාධිතයන් 23 දෙනෙක් හමු වුනා. එයින් දෙදෙනෙක් උඩුගම පොළ භූමියේ වෙළඳාම්වල නියුතු අය නිසා උඩුගම පොළ ඊයේ දිනයේදී වසා දැමුවා. සෞඛ්‍ය නිලධාරීන්ගේ උපදෙස් අනුව නැවත පොළ විවෘත කිරීමට කටයුතු යොදන්නේ මෙම පොළෙත් මුදලාලිලාගේ PCR පරීක්ෂණවලින් අනතුරුවයි. තල්ගස්වල පොළෙත් ව්‍යාපාරිකයන් මෙලෙස PCR පරීක්ෂණවලට ලක් කරන බවට සෞඛ්‍ය නිලධාරීන් මාව දැනුවත් කළා. මේ සියළු ස්ථාන සභාව විසින් විෂබීජහරණය කරන බවත් දන්වන්න කැමතියි. ගරු මන්ත්‍රීවරුනි, මෙම කොරෝනා වසංගතයට මේ වන විට අවුරුද්දකට ආසන්නයි. මෙම රෝගය ආසාධිතයෙක් හැටියට ලංකාවෙදි සොයාගත්තෙ චීන ජාතික කාන්තාවක්. ඊට පසුව මෙය ව්‍යාප්ත වීමේ අවධානම සළකලා, රට වසා දැමීමේ තත්වයට ආවා අපට මතකයි. ඒ කාල වකවානුව තුල අපටද මේ වෙනුවෙන් කැප කිරීමක් රන්න වූ බව ඔබලාට මතක ඇති. කඩවල්, ආයතන වසා තිබෙන විට ජනතාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට අපහමුතාවයට පත්ව ඉන්න කොට අපි විසින් සභා අරමුදල් ගෙන එළවළු ගෙන ඒමට ගොස් අපේ සභාවේ ටිපර් රථය කාර්මික දෝෂයකට පත්වූ බවත්, මතක ඇතැයි සිතමි. ඒ ටිපර් රථය නැවත අළුත්වැඩියා කොට අපට ලැබුනේ දැනට දින කිහිපයකට කලින් බව මම දන්වන්න කැමතියි. ඒ දවස්වල අපගේ සමහර මන්ත්‍රීවරුන්ගේ යෝජනා ක්‍රියාත්මක වුනානම්, අද වෙන කොට සභාවේ මට්ටම මොන විදියට පහත වැටී ඇත්ද කියා සිතන්න. අනාගතය ගැන සිතලා තමයි මම එදා යම් යම් තීරණ ගත්තෙ.

මොකද වෛද්‍ය නිර්දේශ අනුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ අනු දැණුම මත තමයි හැම දේටම අපට සම්බන්ධ වෙන්න පුලුවන් වෙන්නෙ. ඒ අනුව පී.සී.ආර් පරීක්‍ෂණ කරන කටයුත්තෙදි ප්‍රාදේශීය සභාවක් හැටියට අපට කරන්න පුලුවන් උපරිමයෙන් කළා. මෙතන කිය වුන ආකාරයට අපට හැමදේම කරන්න බැහැ. අපි උප්පත්තියේ සිට මරණය දක්වා හැම දේකටම වග කියනවයි කිව්වට හැම දේකටම අපට වග කියා ගන්න හැකියාවකුත් නැහැ. අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අද පාසල් දෙකක විෂබීජහරණය කරන්න ඉල්ලුවා. සමස්ථ පාසල් ටිකම විෂබීජහරණය කරන්න ගියොත් අපි අමාරුවෙ වැටෙනවා. එයට හේතුව අවශ්‍ය ශ්‍රමය නොමැතිවීම නිසා අපට කරගන්න බැහැ. ඔබතුමාල කොච්චර කිව්වත්, අපේ අනිත් සභාවල අපේ සභාවෙ තරම් වැඩ කෙරෙන්නෙ නැහැ. ඊයෙ තවලම සභාපතිතුමා මෙතනට ආවා. මම එතුමාගෙන් ඇහුවා. එතුමාත් ප්‍රකාශ කලේ වැඩ කිරීමේදී සිදුවන අපහසුතාවය තමයි. අපි ෆෙස් බුක් දාන්නෙ නැහැ. බල ප්‍රදේශය තුල ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ප්‍රචාරය යනවා. නිරෝධායනය වුන අයටත් යම් ආහාර මල්ලක් දීම

සම්බන්ධයෙන් නීතියේ ප්‍රතිපාදන තිබෙනමුත්, විශාල වශයෙන් මුලා ප්‍රතිපාදන අවශ්‍ය වන බැවින් , ආහාර මල්ලක් දීගන්න අපට හැකියාවක් නැහැ. මෙම රෝගයේ ව්‍යාප්තිය කොතනින් නිම වේවිද කියා නොදන්නා බැවින්, අපි පවුල් කිහිපයකට දීලා අනිත් අයට දීමට නොහැකිවුනොත්, අපි සභාවක් හැටියට අපහසුතාවයට පත් වෙනවා. නමුත් මේ වන විට රජයෙන් රු. 10000.00 ක වියළි ආහාර මල්ලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලබා දෙනවා. එය නිවැරදිව සෞඛ්‍ය නිලධාරීන්ගේ නිර්දේශ අනුව ක්‍රියාත්මක වන බව මා විසින් සොයා බැලීමේදී දැනගන්නට ලැබුණා.

2020 වර්ෂය එසේ ගෙවී ගියත්, 2021 වර්ෂය පිළිබඳව අපි සුභවාදීව සිතමු. මෙම වර්ෂයේ සියළු මන්ත්‍රීවරුන් සමඟ තම බල ප්‍රදේශවල ඇති යම් යම් අඩුපාඩු හඳුනාගෙන සභා අරමුදල් මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ මුදල් ප්‍රතිපාදන ලබා ගෙන එම අඩුපාඩුවලට සාධාරණයක් ඉටු කිරීමට මම බලාපොරොත්තු වෙනවා. විදුලි පහන් අවශ්‍ය තැන්වලට අවශ්‍ය වීදී පහන් ලබාදීම මෙන්ම, ජේ.සී.බී. යන්ත්‍ර යොදාගෙන අවශ්‍ය අබලන් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමත්, මාගේ බලාපොරොත්තුවක්. මන්ත්‍රී කොට්ඨාස 15 ටම මූලා තත්වය අනුව ලක්ෂ 2 ක ප්‍රතිපාදන වෙන් කිරීමටත්, කොට්ඨාසයේ සියළුම මන්ත්‍රීවරුන් ඒ සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලමි. තමන්ගේ බල ප්‍ර දේශයේ වැඩ කටයුතු පක්ෂපාට නොබලා, සියළුම මන්ත්‍රීවරු එකතුවෙලා වැඩ කරන්න. ගරු සභබන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් මෙම සභාවේ හිටපු සභාපතිවරයෙකු නිසා සභා අරමුදල් බෙදී යන ආකාරය දන්නවා ඇති. මම ඒකයි කිව්වෙ සියළු දෙනා එකතු වී වැඩ කරන්න කියා. තවද, ගරු මන්ත්‍රීවරුනි, 2021 වර්ෂයට අපි පා තැබුවේ, බොහොම සතුටු සිතින්. සභාව තීන්ත ආලේප කර පිරිසිදු කොට, අලුත් හැඟීමකින් සියළුම දෙනා සහභාගී කර ගෙන සාංඝික දානයක් පිරිනමා, තුනුරුවනේ ආශිර්වාද ලබා ගෙනයි. ඒවාගේම සභා ගීතයකුත් නිර්මාණය කොට ඉදිරිපත් කිරීමට මාගේ බලාපොරොත්තුවක් තියෙනවා. ඒවගේම අඩුවක්ව පැවතුනු මන්ත්‍රීවරුන්ගේ නම ඇතුලත් නාමපුවරුව අලුතින් සාදවා ගැනීමටත් කටයුතු කළා. එමෙන්ම අදත් සභාවේ ප්‍රකාශ වුනු, හිටපු සභාපතිවරුගේ පිංතූර පෙර පරිදිම සිහිවටන හැටියට සභාවේ ප්‍රදර්ශනය කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම ගරු මන්ත්‍රීවරුනි විශේෂයෙන් කතා කල යුතු කාරණයක් තමයි. කුඹුරු ඉඩම් ගොඩකිරීම, අනවසර ඉදිකිරීම්. අද දිනත් ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ප්‍රකාශ කල පරිදි කුඹුරු ඉඩම් ගොඩකිරීම් සම්බන්ධව ඉදිරියේදී නම් කුඹුරු ගොඩකිරීමට ඉඩක් නොමැති බව පසුගියදා ගාල්ලේ තිබුනු අමාත්‍ය හමුවකදී ගරු කෘෂිකර්ම ඇමති මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා ප්‍රකාශ කළා. ඉදිරියේදී සියළුම ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, කෘ කැබ්, ටැක්ටර්, ගොයම් කපන යන්ත්‍ර ලබා දීමකරන බවත්, දැනට අතහැර ඇති පුරං කුඹුරු අස්වැද්දීම සඳහා අවශ්‍ය මූල්‍යාධාර ලබා දෙන බවත්, එතුමා ප්‍රකාශ කළා. එනිසා මේ වර්ෂයේදී කෘෂිකර්මයට හොඳ කලක් උදා වේවි කියා අපි සිතනවා. අපිටත් ගම් මට්ටමින් කරන්න පුළුවන් දේ ජනතාව දැනුවත් කරමින් ඉටු කරමු. ඒ වගේම ගරු මන්ත්‍රීවරුනි, මේ දිනවල මුළු ලංකාවෙ වගේම අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙත් මාර්ග කාපට් ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙනවා. සභාවේ යෝජනා අනුව කිලෝමීටර් 15 ක ප්‍රමාණයක් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලගේ, සංවිධායකතුමන්ලගෙ යෝජනා අනුව කිලෝමීටර් 25කුත් මේ වන විට ක්‍රියාත්මකයි. මෙම කාපට් මාර්ග කිලෝමීටර් ලක්ෂයක් ලංකාවේම ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය 2025 වර්ෂය වෙනකම් දිගටම යනවා. ඔබතුමන්ලාත් තම ප්‍රදේශයේ මේ ව්‍යාපෘතිවල අඩුපාඩු සොයා බලා, නිවැරදිව කර ගන්න බලන්න.

ගරු උප සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, අද දින පවත්වන මේ සභා වාරය සාම්ප්‍රදායානුකූලව පවත්වන්නට තිබුනේ ජනවාරි 12 වන දිනයි. නමුත් එය අද දිනට කල් තැබීමට සිදු වූයේ අප සභා බල ප්‍රදේශය තුල ඇති වූ කොරෝනා ව්‍යාප්තිය නිසා. ඒ බව ඔබතුමාලට ක්ෂණිකව දුරකථනයෙන් දැණුම්දුන්නා. පසුව ලිඛිතවද දැණුම් දුන්නා. ඒ අනුව අද දින සභා වාරයට පැමිණි ඔබතුමන්ලාට ස්තූතිවන්ත වෙනවා. ඒවගේම අද දින සභාවාරයට සෞඛ්‍ය හේතූන් මත නොපැමිණි වසන්ත

කුමාරගේ මන්ත්‍රීතුමා, ප්‍රියන්ති මන්ත්‍රීතුමිය සහ නිශාන්ත නන්දන මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කරමින් අද දින සභා වාරයට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා , සභාවේ ලේකම්තුමියට ස්තූතිවන්ත වෙමින් සභාවේ කටයුතු මෙයින් නිම කරනවා. සියළු දෙනාට තෙරුවන් සරණයි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී　　　　　　　　　　දිනය:-